# ජපන් භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්වි භාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*වෙබ් අඩවිය www.nie.lk*

*විද්‍යුත් තැපැල :info@nie.lk*

ජපන් භාෂාව

ගුරු මාර්ගෝපදේශය

11 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්වි භාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*www.nie.lk*

*info@nie.lk*

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත්වන සහ එකොළොස්වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදවු වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය හා අනුමැතිය | - | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය. |
| විෂය විශේෂඥ උපදේශනය | - | ජුන් අරයි<br>ජපන් භාෂා විශේෂඥ<br><br>ආචාර්ය දිල්රුක්ෂි රත්නායක<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| විෂය සම්බන්ධීකරණය | - | මධුභාෂිණී දෙල්දෙණිය<br>සහකාර කථිකාචාර්ය<br>සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්වි භාෂා අධ්‍යාපන<br>දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| ලේඛක මණ්ඩලය | - | |
| අභ්‍යන්තර | | මධුභාෂිණී දෙල්දෙණිය<br>ශාස්ත්‍රවේදී (ගෞරව)<br>ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා<br>ජාතික අධ්‍යාපන ආයතනය, |
| බාහිර | | දිලානි රත්නායක<br>ශාස්ත්‍රවේදී (ගෞරව)<br>සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ 07<br><br>වත්සලා ද සිල්වා<br>ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති<br>උසස් බාලිකා විද්‍යාලය,ගල්කිස්ස<br><br>ගිහානි විමලසේන<br>ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති<br>තක්ෂිලා මහා විද්‍යාලය, ගම්පහ<br><br>ජුන් අරයි<br>ශාස්ත්‍රපති<br>ජපන් භාෂා විශේෂඥ /බාහිර කථිකාචාර්ය<br>කැලණිය විශ්වවිද්‍යාලය |
| පරිගණක වදන් සැකසුම | - | ශිරානි සමරක්කොඩි |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ජපන් භාෂාව 10, 11 ශ්‍රේණි සඳහා පළමු වරට නිපුණතා පාදක නව විෂය නිර්දේශයක් හඳුන්වා දීමට හැකිවී ඇත. නිපුණතාවක් අත්පත්කර ගැනීම යනු යම් කාර්යයක නිරතවීමේ දී, ඉගෙනීමේ දී තමා විසින් ලබා ඇති දැනුම, ආකල්ප කුසලතා යන හැකියාවන් භාවිතයට ගැනීමේ ශක්තියයි. නිපුණතාවක් ලබා ගැනීම සඳහා හැදෑරිය යුතු විෂය සන්ධාරය සහ එක් එක් වාරයට වෙන් කර ඇති කාල පරිච්ඡේද සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන නිපුණතා මට්ටම් කිහිපයක් දක්වා ඇත. එක් එක් නිපුණතා මට්ටමකට ළඟා වීම සඳහා ශිෂ්‍යයකු විසින් අත්පත් කර ගනු ලබන සුවිශේෂ දැනුම ඉගෙනුම් පල යටතේ සඳහන් කර ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතර දී හෝ අවසානයේ දී අපේක්ෂිත ඉගෙනුම් පල ශිෂ්‍යයා විසින් ලබා ගෙන තිබේ ද යන්න මැන බැලීම සඳහා ඇගයීම් හා තක්සේරු නිර්ණායක යොදා ගත යුතු ය.

ජපන් භාෂා විෂය නිර්දේශයේ 10 හා 11 ශ්‍රේණි සඳහා නිපුණතා 08 බැගින් ඇතුළත් කර ඇත. මෙම විෂය නිර්දේශයේ මූලික අරමුණ වන්නේ ව්‍යාකරණ ඉගැන්වීම මගින් නොව දෛනික අවශ්‍යතා, සිතුම් පැතුම් සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය වාක්‍ය රටා සහ සංවාද ප්‍රයෝගික ව පුහුණු වීමෙන් සන්නිවේදන හැකියාව ප්‍රගුණ කිරීමට වැඩි අවස්ථාවක් ලබාදීමයි. විශේෂයෙන් ම ජපන් ජාතිකයන්ගේ ජීවන රටාව හා සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබා දීම තුළින් ජපන් ජාතිකයන්ගේ සිතුම් පැතුම්, ආකල්ප, ආචාර ධර්ම හඳුනාගෙන භාෂාව වඩා හොඳින් හා නිවැරදි ව භාවිත කිරීමට සිසුන් යොමු කළ යුතුය. මෙම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා දැනට තායිලන්තයේ භාවිත කරන පොත් කට්ටලයක් ශ්‍රී ලංකාවට උචිත ලෙස සංස්කරණය කර නිර්දිෂ්ට ග්‍රන්ථ ලෙස තෝරා ගෙන ඇත.

පෙළ පොතේ එක් එක් පාඩමක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ලබා දී ඇත. දී ඇති උපදෙස් ද සැලකිල්ලට ගනිමින් එක් එක් පාඩමෙන් ආවරණය වන විෂය කරුණුවලට අනුකූලව නියම කර ඇති කාලච්ඡේද සඳහා උචිත පාඩමක් සැලසුම් කර ගැනීමේ නිදහස ගුරුවරයාට ලැබේ. නිපුණතා, නිපුණතා මට්ටම් සහ විෂය අන්තර්ගතය කෙරෙහි අවධානය යොමු කරමින් පාඩම අවසානයේ දී අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ශිෂ්‍යයාට ලඟා විය හැකි ආකාරයට 11 ශ්‍රේණියට නියමිත පෙළපොතෙහි සඳහන් මුල් පාඩම් 19 සඳහා යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් මෙහි දක්වා ඇත. පෙළපොතෙහි සඳහන් අවසන් පාඩම් මගින් ජපානයේ සංස්කෘතිය හා ජීවන රටාව පිළිබඳ අවබෝධයක් ලබා දීම අපේක්ෂා කෙරෙන බැවින් මුල් පාඩම් 19 ඉගැන්වෙන අතර දී ම එම දැනුම ශිෂ්‍යයාට ලබා දිය හැකි පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ උපදෙස් මෙහි දක්වා ඇත. එමෙන් ම සවන් දී අවබෝධ කර ගැනීමේ කුසලතාවය දියුණු කිරීමත් ඒ අනුව නිවැරදි උච්චාරණය පුහුණු කිරීමත් අත්‍යවශ්‍ය වන බැවින් පෙළපොතෙහි එන සවන් දීමේ අභ්‍යාස වල නිරත කරවීම අත්‍යාවශ්‍යයෙන්ම කළ යුතු වේ. පෙළපොතෙහි අන්තර්ගත සෑම පාඩමක් සමගම සවන් දීමේ අභ්‍යාස ලබා දී ඇති බැවින් විෂය නිර්දේශයෙහි සඳහන් සවන් දීමේ කුසලතාවය සිසුන්ට ලබා දිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් මෙම ගුරු මාර්ගෝපදේශයෙහි අන්තර්ගත නොවේ. එමෙන්ම සන්නිවේදන කුසලතා දියුණු කිරීම මෙම විෂය නිර්දේශයෙහි මූලික අරමුණ බැවින් ලිවීමේ සහ කියවා අවබෝධ කර ගැනීමේ කුසලතා දියුණු කිරීම සඳහා විෂය නිර්දේශයේ එම නිපුණතා යටතේ ලබා දී ඇති අන්තර්ගතය පිළිබඳව ද සැලකිලිමත් වෙමින් පන්ති කාමරයේදී කළ හැකි ක්‍රියාකාරකම් සැලසුම් කර ගත යුතුය. එබැවින් එම නිපුණතා සම්බන්ධ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපායන්ද මෙහි විශේෂයෙන් සඳහන් කර නොමැත.

ජපන් භාෂාවේ කන්ජි අක්ෂර ඉගැන්වීමේ ක්‍රමෝපායන් පිළිබඳව පොදු උපදෙස් මාලාවක් පළමු ඒකක දෙක යටතේ දක්වා ඇති අතර වර්ෂය පුරාවටම පෙළපොතෙහි එක් එක් පාඩම සමග එහි එන කන්ජි අක්ෂර ඉගැන්වීමට කාලය වෙන් කර ගත යුතුය. ජපන් සංස්කෘතියට අදාළව විශේෂයෙන් දැන ගත යුතු ජපන් ජන සමාජයේ මූලික හරයන් සහ වටිනාකම් පිළිබඳව සිසුන්ට අවබෝධයක් ලබා දීමට පෙළපොතෙහි

පාඩම් ඉගැන්වෙන අතරතුර දී කාලය වෙන් කර ගැනීම අවශ්‍ය වේ. වාචික පරිවර්තනය පිළිබඳ මූලික දැනුමක් ලබා දීම ද මෙම විෂය නිර්දේශයෙන් අපේක්ෂා කෙරෙන අතර පෙළපොතද ඇසුරු කර ගනිමින් අවශ්‍ය ක්‍රියා කාරකම් සැලසුම් කර ගත යතුය. එක් එක් පාඩම සඳහා ලබා දී ඇති ඇගයීම් නිර්ණායක පදනම් කර ගෙන අපේක්ෂිත ඉගෙනුම් පල වෙත ශිෂ්‍යයා ළඟා වී තිබේ දැයි මැන බැලීම සඳහා උචිත ක්‍රමවේදයක් ගුරුවරයා විසින් සැලසුම් කර ගත යුතු වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ලබා දී ඇත්තේ පෙළපොතෙහි එක් එක් පාඩම්වල විෂය අන්තර්ගතය ආවරණය කෙරෙන පොදු උපදෙස් මාලාවකි. එහෙත් එයට සීමානොවී තම හැකියාවන් ද ප්‍රයෝජනයට ගනිමින් උචිත පාඩමක් නිර්මාණාත්මක ව සැලසුම් කර ගැනීමේ නිදහස ගුරුවරයාට ඇත. එමෙන් ම හැකි පමණ පන්ති කාමරයේ දී නවීන තාක්‍ෂණය ද භාවිත කිරීමට උත්සාහ ගත යුතු අතර අන්තර්ජාලය, පොත පත උපයෝගි කර ගනිමින් අමතර දැනුමක් ලබා ගැනීමට ශිෂ්‍යයා යොමු කිරීම වැදගත් වන අතර එක් එක් පාඩමේ සඳහන් විෂය කරුණු සහ වචන මාලාවට පමණක් සීමා නොවී ශිෂ්‍යයා ඒ වන විට ලබා ගෙන ඇති විෂය දැනුම ද උපයෝගි කර ගත හැකි පරිදි පාඩම සැලසුම් කර ගත යුතු වේ.

ව්‍යාපෘති නායක

# පටුන

**පිටු අංක**


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi-vii |
| පටුන | viii |
| විෂය නිර්දේශය | ix |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 1-27 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 28 |

# ජපන් භාෂාව

## විෂය නිර්දේශය

## 11 ශ්‍රේණිය

## 01 විෂය හැඳින්වීම

ජපන් බස මව්බස ලෙස කථා කරන ජනගහනය බිලියන 120කට අධික ය. ඊට අමතර ව ලොව පුරා මිලියන 4කට අධික ජනසංඛ්‍යාවක් විදේශ භාෂාවක් ලෙස ජපන් භාෂාව හදාරති. ජපන් භාෂාවේ ඉතිහාසය සොයා බැලීමේ දී ජපන් භාෂාව සඳහා ලේඛන ක්‍රමයක් හඳුන්වා දී ඇත්තේ වසර 1500 කට පමණ පෙර බව වාර්තා වේ. පළමුවෙන් ම චීනයේ ලේඛන කටයුතු සඳහා භාවිත කරන ලද රූප අක්ෂර වර්ගයක් සේ සැලකෙන කන්ජි අක්ෂර චීන භාෂාවෙන් ජපන් භාෂාවට එකතු වී ඇත. වර්තමානයේ කන්ජි අක්ෂර 1950 පමණ එදිනෙදා ලේඛන කටයුතුවල දී භාවිත වන අතර, ජපානයේ ප්‍රාථමික සහ ද්විතියික පාසල් අධ්‍යාපනය අවසන් වන විට එදිනෙදා භාවිත වන එම කන්ජි අක්ෂර ප්‍රමාණය පිළිබඳ දැනුමක් ලබා ගෙන තිබීම අත්‍යාවශ්‍ය වේ. තවද වසර 1000කට පමණ පෙර තෝරා ගත් චීන අක්ෂර ආශ්‍රිත ව හිරගනා සහ කතකනා අක්ෂර හෝඩි නිර්මාණය කර තිබේ. වර්තමානයේ දී ජපන් ජාතිකයන් මෙම අක්ෂර වර්ග 03 ම භාවිත කරමින් ලේඛන කටයුතුවල යෙදෙයි.

මෙම විෂය නිර්දේශයේ ප්‍රධාන අරමුණු වන්නේ සාම්ප්‍රදායික ව්‍යාකරණ ඉගෙනීමෙන් බැහැර වී දෙන ලද වාක්‍ය රටා ඇසුරින් සංවාද ගොඩ නගමින් කථන කුසලතාව දියුණු කිරීමයි. ඒ සමගම ජපන් සංස්කෘතිය හා සමාජය පිළිබඳ අවබෝධය ලබා ගැනීමේ අවස්ථාව ද මෙමගින් හිමි වේ. ජපන් භාෂාව ඉගෙනීමේ දී එම භාෂාවට අනන්‍ය වූ සංස්කෘතික හා සමාජ වටිනාකම් පිළිබඳ අවබෝධයක් ලබා දීම ද ඉතා වැදගත් ය. ජපන් සමාජයෙන් ලබාගත හැකි උසස් ගුණාංග ජීවිතයට එකතු කර ගැනීමට ද ශිෂ්‍යයන්ට මෙහි දී හැකි වනු ඇත.

ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවට ජපන් භාෂාව හඳුන්වා දී දශක කිහිපයක් ගතවී ඇති අතර අ.පොස.(සා.පෙළ) සහ අ.පො.ස (උ.පෙළ) විභාග සඳහා විෂයයක් ලෙස ජපන් භාෂාව තෝරා ගැනීමේ අවස්ථාව සිසුන්ට ලැබී ඇත. කැලණිය විශ්ව විද්‍යාලය ප්‍රමුඛ විශ්ව විද්‍යාල කිහිපයකින් ම ජපන් භාෂාව සඳහා උපාධි පිරිනමනු ලබයි. අතීතයේ පටන් ශ්‍රී ලංකාව සහ ජපානය අතර ඇති ආර්ථික හා සංස්කෘතික සබඳතා පුළුල් කිරීමේ මගක් ලෙස ශ්‍රී ලංකාව තුළ ජපන් භාෂා අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා ජපන් රජයේ ද විශේෂ සහයෝගය ලැබේ. ජපන් භාෂාව හැදෑරීමෙන් උසස් අධ්‍යාපන අවස්ථා,දෙස් විදෙස් රැකියා අවස්ථා, ව්‍යාපාරික අවස්ථා සඳහා මං පෙත් විවර කර ගැනීමේ අවස්ථාව ශ්‍රී ලාංකිකයන්ට හිමි වී ඇත.

# 02 - ජපන් භාෂාව විෂය අධ්‍යයනයේ අරමුණු

1.0 ජපන් භාෂාවේ ශබ්ද නිවැරදි ව උච්චාරණය කිරිමේ හැකියාව ලබා ගැනීම

2.0 ජපන් භාෂාව නිවැරදි ව ලිවීම සහ කියවීම

3.0 ශ්‍රවණය, කථනය යන කුසලතා දියුණු කිරීම

4.0 සරල කන්ජි ලිවීම, කියවීම සහ අර්ථය අවබෝධ කර ගැනීම

5.0 සංවාද ගොඩ නැගීම සඳහා අවශ්‍ය වාක්‍ය රටා හඳුනා ගැනීම

6.0 මූලික අවශ්‍යතා, සිතුම් පැතුම් සන්නිවේදනය කිරිම සඳහා අවශ්‍ය සරල සංවාද ගොඩ නැගීම

7.0 ජපානයේ උසස් හර පද්ධතීන් හඳුනා ගැනීම සහ ඒවා තම ජීවිතයට එකතු කර ගැනීම

8.0 ජපන් ජාතිකයන්ගේ ජීවන රටාව හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීම

# 03 ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I   මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II   වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III   මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV   පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V   සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI   පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII   ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII   ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## 04 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක,සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# ජපන් භාෂාව- විෂය නිර්දේශය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0 කන්ජි අක්ෂර හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි. | 1.1 කන්ජි අක්ෂර පිළිබඳ මූලික දැනුම ලබා ගනියි. | • කන්ජි අක්ෂර නිර්මාණය වීමේ ඉතිහාසය පිළිබඳ ව මූලික හැඳින්වීම | • කන්ජි අක්ෂර නිර්මාණය වූ ආකාරය පිළිබඳ ව විස්තර කරයි.<br>• කන්ජි අක්ෂරවල ඉතිහාසය පිළිබඳ කෙටි සටහනක් පිළියෙල කරයි.<br>• කන්ජි අක්ෂර ඉගෙනීමේ වැදගත්කම හඳුනා ගෙන විස්තර කරයි. | 10 |
| | 1.2 නිතර භාවිත කරන සරල කන්ජි හා එහි අර්ථය හඳුනා ගනියි. | • සරල කන්ජි 56ක් හා එහි අර්ථය හඳුනා ගැනීම.<br>- සංඛ්‍යා දක්වන කන්ජි<br>- මූලික ක්‍රියා දක්වන කන්ජි<br>- සතියේ දින, මාසයේ දින දක්වන කන්ජි<br>- සරල නාමපද දක්වන කන්ජි | • කන්ජි අක්ෂරය හඳුනා ගෙන අර්ථය කියයි. | |
| | 1.3 නිතර භාවිත කරන සරල කන්ජි ලියයි. | • කන්ජි අක්ෂර ලියන නිවැරදි පිළිවෙළ | • නිවැරදි රේඛා පිළිවෙළ අනුගමනය කරමින් කන්ජි අක්ෂර ලියයි.<br>• මතකයෙන් කන්ජි ලියයි.<br>• අර්ථයට ගැළපෙන නිවැරදි අක්ෂරය ලියයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි. | 2.1. තමන් ප්‍රියකරන දේවල් පිළිබඳ ප්‍රකාශ කරයි | • ක්‍රීඩා<br>• පුද්ගලයින්<br>..... ga suki desu<br>..... ga ichiban suki desu | • යම් ක්‍රීඩාවකට කැමති බව කියයි.<br>• කීපයක් අතුරින් එකකට වඩාත් කැමති බව කියයි.<br>• තමා ප්‍රියකරන පුද්ගලයා පිළිබඳ කියයි. | 10 |
| | 2.2 තම බලාපොරොත්තු, අවශ්‍යතා සහ කැමැත්ත ප්‍රකාශ කරයි. | • බලාපොරොත්තු<br>• අවශ්‍යතා<br>..... ga hoshii desu<br>..... ni naritai desu | • තමාට අවශ්‍ය දේවල් /භාණ්ඩ පිළිබඳ ව කියයි.<br>• තමා ප්‍රියකරන රැකියාව පිළිබඳ පවසයි. | |
| | 2.3 තම අත්දැකීම් පිළිබඳ ව ප්‍රකාශ කරයි. | • ලබා ඇති අත්දැකීම්<br>..... koto ga arimasu | • තමා අතීතයේ දී ලබා ඇති විවිධ අත්දැකීම් පිළිබඳ ව පවසයි. | |
| | 24 ක්‍රියා පදවල සරල අතීත කාල ස්වරූපය භාවිත කර තමන් විසින් කරන ලද කාර්යයන් ප්‍රකාශ කරයි. | • සරල අතීත කාල ස්වරූපය<br>..... mashita | • තමන් කරන ලද ක්‍රියාප්‍රකාශ කිරීම සඳහා සරල වාක්‍ය ගොඩනගයි. | |
| | 2.5 උචිත නිපාත පද සමඟ "යයි" "එයි" ක්‍රියා පද භාවිත කරයි. | • නිපාත පද<br>..... de ikimasu / kimasu<br>..... e ikimasu / kimasu<br>..... to ikimasu/ kimasu<br>..... ni ikimasu/ kimasu | • යම් වාහනයකින් යන/එන බව කියයි.<br>• යන /එන ස්ථානය ප්‍රකාශ කරයි.<br>• තමා සමඟ යන /එන පුද්ගලයන් පිළිබඳ ව පවසයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි. | 3.1 යම් කාර්යයක් කිරීම සඳහා අන්‍යයන්ගේ කැමැත්ත සහ අවසරය ලබා ගනියි. | • කැමැත්ත හා අවසරය ලබා ගැනීම.<br>..... te mo ii desuka | • යම් කාර්යයක් කිරීම සඳහා අන්‍යයන්ගෙන් අවසර ලබා ගනියි.<br>• අදාළ වාක්‍ය රටා ඇසුරින් නිවැරදි වාක්‍ය ගොඩ නගයි. | 16 |
| | 3.2 යම් කාර්යයක් කිරීම සඳහා ආරාධනා කරයි. | • යමක් කිරීමට යෝජනා කිරීම ආරාධනා කිරීම.<br>..... masenka ? | • යම් කාර්යයක් සඳහා අන්‍යයන්ට ආරාධනා කරයි.<br>• අදාළ වාක්‍ය රටා ඇසුරින් සරල සංවාද ගොඩ නගයි. | |
| | 3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි. | • ප්‍රශ්න වාචී පද<br>..... ikura desuka<br>..... doko desuka<br>..... ni nani ga arimasuka<br>..... itsu desuka/ arimasuka<br>..... dare to ..... masuka | • විවිධ ප්‍රශ්නවාචී පද භාවිත කරමින් ප්‍රශ්න අසා තොරතුරු දැන ගනියි.<br>• ප්‍රශ්නවාචී පද භාවිත කරමින් සරල සංවාද ගොඩ නගයි. | |
| | 3.4 වෙනත් කෙනෙකු සතු දෙයක් අගය කරමින් තම අදහස් ප්‍රකාශ කරයි. | • විශේෂණ පද<br>• විශේෂණ පදවල අතීත කාල ස්වරූපය<br>..... keiyôshi + N desu ne | • විශේෂණ පද සහ නාම පද එකතු කරමින් වාක්‍ය ගොඩ නගයි.<br>• අන්‍යයන් සතු දේ අගය කරයි.<br>• සරල සංවාද ගොඩ නගයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි. | 4.1 හිරගනා සහ කතකනා අක්ෂර භාවිත කර ලියයි. | • හිරගනා සහ කතකනා භාවිතය | • හිරගනා සහ කතකනා අක්ෂර භාවිත කළ යුතු අවස්ථා වෙන් වෙන්ව හඳුනා ගෙන අදාළ අක්ෂර භාවිත කර ලියයි. | 10 |
| | 4.2 සරල කන්ජි භාවිත කර වචන/වාක්‍ය ලියයි. | • පෙළ පොතෙහි සඳහන් කන්ජි අක්ෂර<br>• කන්ජි අක්ෂර සහිත වචන | • නිවැරදි කන්ජි භාවිත කර වචන/ වාක්‍ය ලියයි. | |
| | 4.3 තමා පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලියයි. | • තමා පිළිබඳ විස්තර<br>• පවුලේ සාමාජිකයින් පිළිබඳ විස්තර<br>• කැමැත්ත, අවශ්‍යතා සහ බලාපොරොත්තු පිළිබඳ සටහන් කිරීම.<br>- කෙටි සටහන්<br>- සටහන්<br>• දෛනික කටයුතු<br>• සති අන්තය, නිවාඩු දිනය ගත කල ආකාරය | • තමා ප්‍රියකරනදේ, අවශ්‍යතා සහ බලාපොරොත්තු පිළිබඳ කෙටි සටහන් ලියයි.<br>• තමා සහ සමීපතයින් පිළිබඳ සරල විස්තරයක් ලියයි.<br>• තම දෛනික සැලසුම් ලියයි.<br>• තම සති අන්තය ගත කළ ආකාරය පිළිබඳ ලියයි. | |
| | 4.4 යමක් සඳහා අවසර ලබාගැනීම සහ ආරාධනා කිරීම ලිඛිත ව සිදුකරයි. | • කෙටි සටහන්<br>• පණිවිඩ/ කෙටි පණිවිඩ | • වාක්‍ය ඛණ්ඩ සහ සරල වාක්‍ය භාවිත කර යමකට අවසර ලබා ගනියි.<br>• යම් කාර්යයක් සඳහා ලිඛිත ව ආරාධනා කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5.0 ජපන් බසින් ලියා ඇති තොරතුරු සහ සටහන් කියවා අවබෝධ කර ගනියි. | 5.1 හිරගනා සහ කතකනා අක්ෂරවලින් ලියූ වාක්‍ය කියවා අවබෝධ කර ගනියි.<br>5.2 සරල කන්ජි භාවිත කර ලියූ වචන/වාක්‍ය කියවා අවබෝධ කර ගනියි.<br>5.3 සරල ජපන් භාෂාවෙන් ලියන ලද වාක්‍ය සහ ඡේද කියවා අවබෝධ කර ගනියි. | • හිරගනා සහ කතකනා අක්ෂරවලින් ලියූ තොරතුරු සහ සටහන්<br>• පෙළ පොතෙහි සඳහන් කන්ජි අක්ෂර<br>• පෙළ පොතෙහි ඇතුළත් වාක්‍ය<br>• සරල ඡේද | • හිරගනා සහ කතකනා අක්ෂරවලින් ලියූ වාක්‍ය හඬනගා කියවයි.<br>• තොරතුරු සහ සටහන් කියවා අර්ථය අවබෝධ කර ගනියි.<br>• කන්ජි අක්ෂර සහිත වචන කියවා අර්ථය පැහැදිලි කරයි.<br>• පෙළපොතෙහි සඳහන් දෙබස් කියවා අවබෝධ කර ගනියි.<br>• සරල ඡේද අවබෝධයෙන් යුතුව කියවයි. | 10 |
| 6.0 ජපන් භාෂාවෙන් ලබා දෙන පණිවිඩ, තොරතුරු, උපදෙස් සහ සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි. | 6.1 ජපන් භාෂාවට සවන් දී උච්චාරණ විලාසය, හඬෙහි උස්පහත්බව සහ උච්චාරණ සුවිශේෂතා හඳුනා ගනියි.<br>6.2 දෛනික ජීවිතයට අවශ්‍ය පණිවුඩ, තොරතුරු සහ උපදෙස්වලට සවන් දී අවබෝධ කර ගනියි.<br>6.3 සරල සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි. | • ජපන් භාෂාවේ උච්චාරණය සහ උච්චාරණ සුවිශේෂතා<br>• ශබ්ද උච්චාරණයෙහි උස් පහත්බව<br>• දෛනික ජීවිතයට වැදගත්වන වචන මාලාව<br>• විදේශ භාෂාවලින් එකතු වූ වචන<br>• සරල වාක්‍ය<br>• සරල සංවාද<br>• ප්‍රශ්න හා පිළිතුරු සහිත වාක්‍ය | • ජපන් බසට සවන් දී උච්චාරණ සුවිශේෂතා හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය කරයි.<br>• හඬෙහි උස් පහත්බව හඳුනා ගෙන අනුකරණය කරයි.<br>• සරල වාක්‍යවලට සවන් දී මව් බසින් අර්ථය කියයි.<br>• සංවාදවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.<br>• අසන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලබාදෙයි. | 10 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| 7.0 ජපන් සමාජය සහ සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි. | 7.1 ජපන් ජන සමාජයේ මූලික හර පද්ධතිය, සිතුම් පැතුම් හා ආචාර ධර්ම හඳුනාගෙන එම වටිනා ගුණාංග තම ජීවිතයට එකතුකර ගනියි. | • S5 සංකල්පය<br>• ජපන් ජාතිකයන්ගේ විනයානුකූලභාවය<br>• අන්‍යයන් පිළිබඳ සිතීම<br>• වෙලාව පිළිපැදිම | • නිවසේ දී සහ පාසලේ දී S5 සංකල්පය ක්‍රියාත්මක කරයි.<br>• පාසලේ දී සහ සමාජයේ දී විනයානුකූල ව හැසිරෙයි.<br>• අන්‍යයයන් පිළිබඳ ව හැඟීමෙන් කටයුතු කරයි.<br>• දෛනික කටයුතු පිළිවෙළකට සැලසුම් කරයි.<br>• වෙලාව පිළිපදියි. | 15 |
| | 7.2 ජපන් ජාතිකයන් සමඟ සාර්ථකව අදහස් හුවමාරුකර ගැනීමට සහ ජපන් සමාජයට හැඩ ගැසීමට අවශ්‍ය මූලික කරුණු අවබෝධ කර ගනියි. | • නිවැරදි ලෙස අවස්ථානුකූලව ආචාර පද භාවිතය<br>• පෙර සූදානමක සහ සැලසුමක වැදගත්කම | • සුදුසු අවස්ථාවලදී නිවැරදි ආචාර පද භාවිත කරයි.<br>• තම කාර්යයන් සැලසුමකට අනුව ඉටුකරයි. | |
| | 7.3 ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් මව් බසින් ප්‍රකාශ කරයි. | • ජපානයේ ක්‍රීඩා<br>- ව්‍යායාම<br>- කෙන්දෝ, සුමෝ, ජුඩෝ,<br>• ද්විතියික සහ උසස් පාසල්වල සිසුන් නිරත වන ක්‍රීඩා<br>• දෙරටේ ක්‍රීඩා අතර සමාන අසමානතා | • ජපානයේ ජනප්‍රිය ක්‍රීඩා නම් කරයි.<br>• ජපානයේ ක්‍රීඩා හා ඒවායේ සුවිශේෂතා ලක්ෂණ කෙටියෙන් විස්තර කරයි.<br>• පාසල් සිසුන් නිරත වන ක්‍රීඩා හඳුන්වයි.<br>• දෙරටේ ක්‍රීඩා සන්සන්දනය කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | • ජපානයේ නිෂ්පාදන<br>- ජනප්‍රිය ජපන් නිෂ්පාදන සහ වෙළඳ නාමයන්<br>- ජපන් ජාතිකයින් ලොවට හඳුන්වා දුන් සුවිශේෂී ජපන් නිෂ්පාදන<br>- ජපන් නිෂ්පාදනවලට ආවේනික සුවිශේෂි ලක්ෂණ | • ජනප්‍රිය ජපන් නිෂ්පාදන නාම නම් කරයි.<br>• සුවිශේෂි ජපන් නිෂ්පාදන හඳුන්වයි.<br>• ජපන් නිෂ්පාදනවල සුවිශේෂතා අගය කරයි<br>• දෙරටේ නිෂ්පාදනවල ප්‍රමිතිය හා තත්ත්වය සසඳයි. | 10 |
| | | • ජපානයේ පාසල් සිසුන්ගේ දෛනික වියදම්<br>- දිනකට ලැබෙන මුදල සහ මාසික වියදම<br>- ජංගම දුරකථන භාවිතය<br>- අර්ධ කාලීන රැකියාවල නිරතවීම<br>- මුදල් වියදම් කරන ආකාරය | • ජපන් ජාතික සිසුන්ගේ දෛනික වියදම් පිළිබඳ විස්තර කරයි.<br>• සම වයසේ ශ්‍රී ලාංකික සිසුන් සමඟ සසඳයි. | |
| | | • ජපානයේ ප්‍රවාහන කටයුතු<br>- ජපානයේ බහුල ව භාවිත කරන ප්‍රවාහන මාධ්‍ය<br>- ප්‍රධාන ප්‍රවාහන මාධ්‍යවල සුවිශේෂි ලක්ෂණ | • ජපානයේ ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය නම් කරයි.<br>• ජපානයේ ප්‍රවාහන මාධ්‍යවල ඇති පහසුකම් විස්තර කරයි.<br>• දෙරටේ ප්‍රවාහන මාධ්‍ය සසඳා අදහස් ප්‍රකාශ කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | • ජපන් තරුණ පරපුරේ සංස්කෘතිය හා විලාසිතා<br>- ප්‍රියකරන සංගීතය<br>- ජනප්‍රිය විලාසිතා<br>- ප්‍රියකරන කාටූන් සහ වෙනත් වැඩසටහන් | • ජපන් යෞවනයින් ප්‍රියකරන සංගීතය පිළිබඳ අදහස් පල කරයි.<br>• ජපන් යෞවනයන්ගේ විලාසිතා ශ්‍රී ලාංකික තරුණ පරපුර සමඟ සසඳයි. | |
| | | • ජපන් ජාතිකයින්ගේ ජීවිතයේ වැදගත් අවස්ථා<br>- දරුවෙකුගේ ඉපදීම<br>- දරුවන් පාසලකට ඇතුළත් කිරීම<br>- විවාහය<br>- මුලින්ම රැකියාවකට යෑම | • දෙරටේ යෞවනයන්ගේ සංස්කෘතිය සසඳමින් අදහස් ප්‍රකාශ කරයි.<br>• ජපන් ජාතිකයන්ගේ ජීවිතයේ වැදගත් අවස්ථා නම් කර, විස්තර කරයි. | |
| | | • ජපන් ජාතිකයන්ගේ බඩු මිල දී ගැනීම.<br>- බඩු මිල දී ගන්නා ස්ථාන<br>- සුවිශේෂී වෙළඳ සැල් | • බඩුමිල දී ගැනීම සඳහා අවශ්‍ය සරල සංවාද ගොඩනගයි.<br>• ජපන් ජාතිකයන්ගේ බඩු මිල දී ගැනීමේ චර්යා මොනවාදැයි පැහැදිලි කරයි. | |
| | | • ජපානයේ වාර්ෂික උත්සව | • වාර්ෂික උත්සව නම් කර කෙටියෙන් විස්තර කරයි.<br>• වාර්ෂික උත්සවවල සුවිශේෂත්වය විස්තර කරයි. | |
| | | • ජපානයේ ඉතිහාසය | • ඉතිහාසයේ ප්‍රධාන සංවර්ධන අවදි නම් කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 8.0 දෙබස් සහ සංවාද ජපන් බසින් සිංහල භාෂාවටත්, සිංහල බසින් ජපන් භාෂාවටත් වාචික ව පරිවර්තනය කරයි. | 8.1 සරල දෙබස් ජපන් භාෂාවෙන් සිංහල භාෂාවට වාචික ව පරිවර්තනය කරයි.<br><br>8.1 සරල දෙබස් සිංහල භාෂාවෙන් ජපන් භාෂාවට වාචික ව පරිවර්තනය කරයි. | • පරිවර්තනයක දී අවධානය යොමු කළ යුතු කරුණු<br><br>• විවිධ මාතෘකා යටතේ එන සරල සංවාද<br>• පෙළ පොතෙහි දී ඇති සංවාද | • වාචික පරිවර්තනයක දී අනුගමනය කළ යුතු කරුණු විස්තර කරයි.<br><br>• හඬ පටවලට සවන් දී එහි එන සංවාද සිංහල භාෂාවට පරිවර්තනය කරයි.<br><br>• පෙළ පොතෙහි සඳහන් දෙබස් සිංහල බසට වාචික ව පරිවර්තනය කරයි.<br><br>• ගුරුවරයා ලබා දෙන දෙබස් සහ සංවාද ජපන් බසින් සිංහල බසටත් සිංහල බසින් ජපන් බසටත් පරිවර්තනය කරයි. | 10 |

## නිර්දිෂ්ට ග්‍රන්ථ (අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට නියමිත)

- Koharu to Isshoni – Nihongo I
- Koharu to Isshoni – Nihongo II

## අතිරේක කියවීම

- Nihongo shoho,The Japan Foundation, 1985
- Japanese for young people I – student book
- Japenese for young people I – kana work book

## 04 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද

- ප්‍රශ්නෝත්තර ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- දේශන
- පැවරුම්
- කේවල/කණ්ඩායම් ක්‍රියාකාරකම්
- විනෝදාත්මක ක්‍රීඩා
- කේවල/ කණ්ඩායම් ඉදිරිපත් කිරීම්
- සාකච්ඡා

# 05 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

- ජපන් භාෂා දිනයක් පැවැත්වීම
- බිත්ති පුවත්පතක් පවත්වා ගෙන යැම
- මාසික සඟරාවක් සකස් කිරීම
- ප්‍රදර්ශන, වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම
- පන්ති මට්ටමෙන් පුස්තකාලයක් පවත්වා ගෙන යැම
- ජපානයේ සංස්කෘතිය පිළිබඳ ව පොත් පිංචක් සකස් කිරීම.
- ජපානයේ සංස්කෘතික උත්සව නිමිතිකරගෙන විශේෂ වැඩ සටහන් සංවිධානය කිරීම

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

**ඒකකය 01**

**නිපුණතාව**

1.0 කන්ජි අක්ෂර හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.1 කන්ජි අක්ෂර පිළිබඳ මූලික දැනුම ලබා ගනියි.

**කාලච්ඡේද 02 යි**

**ඉගෙනුම් පල**

- කන්ජි අක්ෂර නිර්මාණය වූ ආකාරය පිළිබඳ ව විස්තර කරයි.
- කන්ජි අක්ෂරවල ඉතිහාසය පිළිබඳ ව කෙටි සටහනක් පිළියෙල කරයි
- කන්ජි අක්ෂර ඉගෙනීමේ වැදගත්කම හඳුනා ගෙන විස්තර කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කන්ජි අක්ෂරවල විකාශනය
- කන්ජි අක්ෂර ඉගෙනීමේ වැදගත්කම
- කන්ජි අක්ෂර කියවීමේ ක්‍රම
- කන්ජි අක්ෂර ලිවීමේ අනුපිළිවෙළ

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- කන්ජි අක්ෂරවල ඉතිහාසය පිළිබඳ ව සරල හැඳින්වීමක් කරන්න.
- කන්ජි අක්ෂර යනු චීන භාෂාවේ රූපාක්ෂර ඇසුරින් සකස්කර ගත් රූපාක්ෂර විශේෂයක් බව හඳුන්වා දෙන්න.
- කන්ජි අක්ෂරවල විකාශනය පැහැදිලි වන සේ අඳින ලද කාඩ්පත් ඇසුරින් කන්ජි අක්ෂරවල විකාශනය පැහැදිලි කරන්න.
- ජපන් හා හිරගනා අක්ෂරවලින් පමණක් ලියූ විට කියවීමට හා අර්ථය තේරුම් ගැනීමට අපහසු වන අවස්ථා ද ඇති බැවින් සහ කන්ජි අක්ෂරයක් මගින් වචනයක් හෝ එහි අර්ථය ප්‍රකාශිත බැවින් ද කන්ජි අක්ෂර ඉගෙනීම වැදගත් වන බව උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.
- සරල කන්ජි අක්ෂර කිහිපයක නිවැරදි ලිවීමේ අනුපිළිවෙළ කළු ලෑල්ලේ සටහන් කරමින් කන්ජි අක්ෂර ලිවීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි අනුපිළිවෙළක් ඇති බව වටහා දෙන්න.
- එක් කන්ජි අක්ෂරයකට " Kunyomi "සහ " onyomi" යනුවෙන් කියවීමේ ක්‍රම 2ක් ඇති බව සරල උදාහරණ ඇසුරින් පහදන්න.
- සිසුන් කණ්ඩායම් කර කන්ජි අක්ෂරවල විකාශනයේ විවිධ අවස්ථා අඳින ලද කාඩ්පත් ලබා දී අදාළ කන්ජි අක්ෂරයේ විකාශනය පැහැදිලි වන සේ නැවත සකස් කිරීමේ ක්‍රියාකාරකමක නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- කන්ජි අක්ෂරවල විකාශනය අඳින ලද කාඩ්පත්
- විවිධ රූප ඇසුරින් බිහි වූ කන්ජි අක්ෂර දැක්වෙන කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- කන්ජි අක්ෂරවල විකාශනය සහ ඉතිහාසය පිළිබඳ ව කෙටි සටහනක් ලියයි.

**ඒකකය 02**

**නිපුණතාව**

1.0 කන්ජි අක්ෂර හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි.

4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි.

5.0 ජපන් බසින් ලියා ඇති තොරතුරු සහ සටහන් කියවා අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

1.2 නිතර භාවිත කරන සරල කන්ජි හා එහි අර්ථය හඳුනා ගනියි.

1.3 නිතර භාවිත කරන සරල කන්ජි ලියයි.

4.2 සරල කන්ජි භාවිත කර වචන/වාක්‍ය ලියයි.

5.2 සරල කන්ජි භාවිත කර ලියූ වචන/වාක්‍ය කියවා අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 08 යි**

**ඉගෙනුම් පල**

- කන්ජි අක්ෂරය හඳුනා ගෙන අර්ථය කියයි.
- නිවැරදි රේඛා පිළිවෙළ අනුගමනය කරමින් කන්ජි අක්ෂර ලියයි.
- මතකයෙන් කන්ජි ලියයි.
- අර්ථයට ගැළපෙන නිවැරදි අක්ෂරය ලියයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පෙළපොතෙහි සඳහන් කන්ජි අක්ෂර 56
- කන්ජි අක්ෂරවල අර්ථය
- කන්ජි අක්ෂරවල නිවැරදි රේඛා අනුපිළිවෙළ

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- එක් එක් පාඩමට අයත් කන්ජි අක්ෂර විශාල කර ලියන ලද කාඩ්පතක් ප්‍රදර්ශනය කර එහි අර්ථය හඳුන්වා දෙන්න
- කන්ජි අක්ෂර ලිවිය යුතු නිවැරදි රේඛා පිළිවෙළ හඳුන්වා දෙන්න.
- උගත් අක්ෂර හිස් අවකාශයේ ලියමින් පුහුණු කරවන්න.
- එදිනෙදා උගත් කන්ජි අක්ෂර ලියූ කාඩ්පත් පන්ති කාමරයේ තෝරාගත් ස්ථානයක අලවා ප්‍රදර්ශනය කරවන්න.
- ගුරුවරයා පෙන්වනු ලබන කන්ජි අක්ෂර හඳුනා ගෙන එහි අර්ථය ප්‍රකාශ කිරීම සහ ගුරුවරයා පවසන අර්ථයට අදාළ කන්ජි අක්ෂර අනෙක් කන්ජි අක්ෂර අතුරින් තෝරා පෙන්වීමේ ක්‍රියාකාරකමක් කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතෙහි සඳහන් කන්ජි අක්ෂර විශාල කර ලියූ කාඩ්පත් ( A4 ප්‍රමාණයේ )

**තක්සේරුව හා ඇගයීම**

- පෙළපොතෙහි සඳහන් කන්ජි අක්ෂරවල අර්ථය පවසයි.
- පෙළපොතෙහි සඳහන් කන්ජි අක්ෂර නිවැරදි රේඛා අනුපිළිවෙළට අනුව ලියයි.

**ඒකකය 03**

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි.

7.0 ජපන් සමාජය සහ සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

2.1. තමන් ප්‍රියකරන දේවල් පිළිබඳ ප්‍රකාශ කරයි

3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි.

3.4 වෙනත් කෙනෙකු සතු දෙයක් අගය කරමින් තම අදහස් ප්‍රකාශ කරයි.

7.3 ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් මව් බසින් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි**

**ඉගෙනුම් පල**

- තමා කැමති ක්‍රීඩාව පිළිබඳ ප්‍රකාශ කරයි.
- වෙනත් කෙනෙකු කැමති ක්‍රීඩා පිළිබඳ ව විමසා දැනගනියි.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ක්‍රීඩා පිළිබඳ ව සන්සන්දනය කරමින් මව්බසින් අදහස් ප්‍රකාශ කරයි.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් නිරත වන ක්‍රීඩා නම් කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ශ්‍රී ලංකාවේ සහ ජපානයේ ජනප්‍රිය ක්‍රීඩා හඳුන්වන වචන මාලාව
- ".......... ga suki desu " වාක්‍ය රටාව
- ජපානයේ සම්ප්‍රදායික සහ ජනප්‍රිය ක්‍රීඩා පිළිබඳ තොරතුරු

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 01**

- විවිධ ක්‍රීඩා දැක්වෙන පින්තූර කාඩ්පත් ඇසුරින් එහි සඳහන් ක්‍රීඩා ජපන් බසින් හඳුන්වා දෙන්න.
- ක්‍රීඩාවකට කැමැත්ත ප්‍රකාශ කිරීමට අදාළ වාක්‍ය රටාව හඳුන්වා දෙන්න.
- පින්තූර කාඩ්පත් ඇසුරින් හඳුන්වා දුන් ක්‍රීඩා පිළිබඳ ව තම කැමැත්ත පළකරන ආකාරය මෙම වාක්‍ය රටාවට අනුව පුහුණු කරවන්න.
- ශ්‍රී ලංකාවේ දක්නට නැති ජපානයේ දක්නට ලැබෙන ක්‍රීඩා කෙටියෙන් හඳුන්වා දෙන්න.
  උදා Sumo, kendo, Aikido
- පෙළපොතෙහි සඳහන් සංවාද ඇසුරින් වෙනත් කෙනෙකු කැමති ක්‍රීඩාව පිළිබඳ විමසා දැන ගනිමින් අදහස් ඉදිරිපත් කරන ආකාරය පුහුණු කරන්න.
- පන්ති කාමරය තුළ දී සිදුකළ හැකි නිර්මාණාත්මක විනෝද ජනක ක්‍රීඩාවක් හඳුන්වා දෙන්න.
- ජපානයේ හා ශ්‍රී ලංකාවේ ක්‍රීඩා පිළිබඳ කණ්ඩායම් පෝස්ටරයක් නිර්මාණය කරවන්න.

**පියවර 02**

- ජපන් ශිෂ්‍යයන් එදිනෙදා පාසලේ දී සිදුකරන ක්‍රීඩා පිළිබඳ අන්තර්ජාලය හෝ පොත්පත් ඇසුරින් සොයා ගත් තොරතුරු ගොනු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න. (උදා: Judo, Karate, Aikido, Kendo, kyudo)
- ජපන් ශිෂ්‍යයන් නිරත වන සාම්ප්‍රදායික ක්‍රීඩා සහ සාම්ප්‍රදායික නොවන ක්‍රීඩා පිළිබඳ ව සිසුන් දැනුවත් කරමින් සාකච්ඡා කරන්න.
- පාසල් කාලයෙන් පසු පවත්නා ක්‍රීඩා පුහුණුවීම් ලෙස ජපානයේ හා ශ්‍රී ලංකාවේ පාසල්වල දක්නට ඇති ක්‍රීඩා පිළිබඳ සන්සන්දනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ජපානයේ ක්‍රීඩා ඇතුළත් ඡායාරූප හෝ වීඩියෝ පටයක් නැරඹීමට අවස්ථාවක් ලබා දී වැඩිදුරටත් කරුණු සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ක්‍රීඩාවල රූප කාඩ්පත් /ඡායාරූප
- පෙළපොත (පාඩම 29 සහ 49 පාඩම)
- DVD තැටි

**තක්සේරුව හා ඇගයීම**

- ප්‍රියකරන ක්‍රීඩාව පිළිබඳ ව කථා කරයි.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ ක්‍රීඩා පිළිබඳ ව සසඳමින් අදහස් ප්‍රකාශ කරයි.
- විවිධ ක්‍රීඩා ජපන් බසින් හඳුන්වයි.

**ඒකකය 04**

**නිපුණතාව**

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි

**නිපුණතා මට්ටම**

3.4 වෙනත් කෙනෙකු සතු දෙයක් අගය කරමින් තම අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි**

**ඉගෙනුම් පල**

- ඇඳුම් පැලඳුම් ජපන් බසින් හඳුන්වයි.
- වෙනත් කෙනෙකු සතු දෙයක් අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි.
- වෙනත් කෙනෙකුගේ හැකියා පිළිබඳ ව ප්‍රශංසනීය ව අගය කරයි.
- තමා ව අගය කිරීමේ දී නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ඇඳුම් පැලඳුම් හඳුන්වන වචන මාලාව
- යම් දෙයකට කෙනෙකු දක්ෂ බව ප්‍රකාශ කිරීමට අවශ්‍ය "joosu desu" සහ "tokui desu" භාවිතය
- " ........... ga.......... desu ne " වාක්‍ය රටාව
- ජපානයේ යෞවනයන් විවේකය ගතකරන ආකාරය

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 01**

- ඇඳුම් පැලඳුම්වල රූප, කාඩ්පත් හෝ සැබෑ ද්‍රව්‍ය ඉදිරිපත් කරමින් ජපන් භාෂාවෙන් වචන මාලාව හඳුන්වා දෙන්න.
- අන්‍යයන් සතු දේ අගය කිරීම සඳහා භාවිත කළ හැකි විශේෂණ පද කිහිපයක් හඳුන්වා දෙන්න.
- විශේෂණ පද යොදා වෙනත් කෙනෙකුගේ ඇඳුම් පැලඳුම් පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වාක්‍ය රටාව හඳුන්වා දී පෙළපොත ඇසුරින් දී ඇති සංවාද පුහුණු වීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 02

- ශිෂ්‍යයන්ගේ විවිධ දක්ෂතා විමසමින් කලුලෑල්ලේ සටහන් කරන්න. (උදා චිත්‍ර, ක්‍රීඩා, ගායනය, වාදනය)
- කෙනෙකුගේ දක්ෂතාවන් අගය කිරීමට භාවිත කරන වාක්‍ය රටාව හඳුන්වා දී සංවාද පුහුණු කරන්න.

පියවර 03

- ජපන් ජාතික තරුණ තරුණියන් තම විනෝදය ගත කරන ආකාරය පිළිබඳ ශිෂ්‍යයන් දන්නා කරුණු ඇසුරින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ගුරුවරයා පෙර සූදානම් කර ගෙන පැමිණි තොරතුරු සිසුන්ට අනාවරණය කරන්න.
- ශ්‍රී ලාංකික තරුණ තරුණියන් විනෝදය ගත කරන ආකාරය සමඟ සන්සන්දනය කරමින් කණ්ඩායම් ලෙස එකතු කර ගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා අවශ්‍ය තැන්වල දී ඌණ පූරණය සිදු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ඇඳුම් පැලඳුම්වල රූප කාඩ්පත් හෝ සැබෑ ද්‍රව්‍ය
- පෙළපොත ( 30 පාඩම)

**තක්සේරුව හා ඇගයීම**

- තමා සතු දෙයක් හෝ තම දක්ෂතාවන් අගය කිරීමේ දී නිවැරදි ව ප්‍රතිචාර දක්වයි.
- අන්‍යයන් සතු දේ සහ දක්ෂතා අගය කරයි.

## ඒකකය 05

**නිපුණතාව**

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි

7.0 ජපන් සමාජය සහ සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි.

7.3 ශ්‍රී ලංකාවේ සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් මව් බසින් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි**

**ඉගෙනුම් පල**

- යමක් තුළ තිබෙන භාණ්ඩ හා උපකරණ පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- යමක් තුළ තිබෙන දේවල් පිළිබඳ ව අන් අයගෙන් විමසා දැන ගනියි.
- නාම පද කිහිපයක් නිපාත පද මගින් සම්බන්ධ කොට වාක්‍ය ගොඩ නගයි.
- ජනප්‍රිය ජපන් නිෂ්පාදන නම් කරයි.
- ජපන් නිෂ්පාදන සහ ශ්‍රී ලාංකික නිෂ්පාදන සසඳමින් අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ප්‍රශ්නවාචී පද
- නිපාත පද මගින් නාම පද සම්බන්ධ කර වාක්‍ය ගොඩනැගීම.
- නාම පද කිහිපයක් සම්බන්ධ කිරීම සඳහා යොදන " to" සහ " ya " නිපාත පද භාවිතය.
- "................ no naka ni ........ ga arimasu" වාක්‍ය රටාව
- ජපානයේ ජනප්‍රිය වෙළඳ නාම සහ සුප්‍රසිද්ධ ජපන් නිෂ්පාදන පිළිබඳ ව තොරතුරු

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 01**

- විවිධ උපකරණ අඩංගු පාසල් බෑගයක් හෝ උපකරණ අඩංගු පාසල් බෑගයක රූප සටහනක් පෙන්වමින් එහි තිබෙන උපකරණ ජපන් බසින් හඳුන්වා දෙන්න.
- අදාළ වාක්‍ය රටාව හඳුන්වා දෙන්න.
- ඉහත වාක්‍ය රටාව භාවිත කර සිසුන්ගේ බෑගය තුළ තිබෙන ද්‍රව්‍ය පිළිබඳ ව විමසමින් පිළිතුරු ලබා ගන්න.
- නාම පද කිහිපයක් සම්බන්ධ කර ගනිමින් වාක්‍ය රටා ගොඩනගන අයුරු පුහුණු කරවන්න.
- යහළුවන් කිහිපදෙනෙකුගේ පාසල් බෑගය තුළ තිබෙන ද්‍රව්‍ය පිළිබඳ ව විමසා සටහන් කොට ගෙන පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.

පියවර 02

- ප්‍රසිද්ධ ශ්‍රී ලාංකික නිෂ්පාදන සහ ජපන් නිෂ්පාදනවල රූප සහ තොරතුරු සොයා ගෙන ඒමට සලස්වා මව්බසින් ප්‍රකාශ කිරීමට සලස්වන්න.
- ජනප්‍රිය ජපන් නිෂ්පාදන පිළිබඳ ව සිසුන් දන්නා දේ ගැන සාකච්ජාවක නිරත වන්න.
- ශ්‍රී ලාංකික නිෂ්පාදන හා ජපන් නිෂ්පාදන සසඳමින් සාකච්ජාවක් මෙහෙයවන්න.
- ජපන් නිෂ්පාදන සහ ඒවායේ සුවිශේෂත්වය පිළිබඳ තොරතුරු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළ පොත (31 පාඩම සහ 49 පාඩම)
- රූප කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- පාසල් බෑගයේ තිබෙන ද්‍රව්‍ය නම් කර පවසමින් වාක්‍ය ගොඩනගයි.
- ජපානයේ ජනප්‍රිය නිෂ්පාදන නම් කරයි.
- ජපන් නිෂ්පාදනවල සුවිශේෂී ලක්ෂණ විස්තර කරයි.
- ජපන් නිෂ්පාදනවල සුවිශේෂ බව ඇසුරින් ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් නව නිෂ්පාදනයක් පිළිබඳ ව කණ්ඩායම් වශයෙන් සිතා චිත්‍රයට නගා එහි කාර්යය මව්බසින් විස්තර කරයි.

**වැඩිදුර ගවේෂණය**

- https : // minnanokyozai.jp.eringa chosen  nihongo dekimsu

## ඒකකය 06

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි.

6.0 ජපන් භාෂාවෙන් ලබාදෙන පණිවිඩ තොරතුරු උපදෙස් සහ සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි.

6.1 ජපන් භාෂාවට සවන් දී උච්චාරණ විලාශය, හඬෙහි උස්පහත් බව සහ උච්චාරණ සුවිශේෂිතා හඳුනා ගනියි.

6.2 දෛනික ජීවිතයට අවශ්‍ය පණිවිඩ තොරතුරු සහ උපදෙස්වලට සවන් දී අවබෝධ කර ගනියි.

6.3 සරල සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම්පල**

- නිවාඩු දිනයක දී / සති අන්තයේ දී තමා යන ස්ථාන පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- නිවාඩු දිනයක දී මිතුරන් යන ස්ථාන පිළිබඳ විමසා දැනගනියි.
- නිවාඩු දිනය සම්බන්ධ ව සරල සංවාද ගොඩ නගයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිවාඩු දිනය ගත කිරීමට යන විවිධ ස්ථාන
- "e" නිපාතය වෙනුවට "ni " නිපාතය යොදා ගැනීම.
- "................ ni ........ e ikimasu" වාක්‍ය රටාව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

පියවර 1

- නිවාඩු දිනවල සාමාන්‍යයෙන් ශ්‍රී ලාංකිකයන් යන ස්ථාන සහිත රූප කාඩ්පත් ප්‍රදර්ශනය කරමින් එම ස්ථානවලට අමතර ව නිවාඩු දිනවල දී සිසුන් යන ස්ථාන පිළිබඳවද ඔවුන්ගෙන් විමසන්න.
- පෙළපොත ද ඇසුරු කර ගනිමින් විවිධ ස්ථාන ජපන් බසින් හඳුන්වා දෙන්න.
- අදාළ වාක්‍ය රටා හඳුන්වා දී පෙළපොත ඇසුරින් සංවාද පුහුණු වීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ ස්ථානවල රූප කාඩ්පත් (උදා: ළමා උයන, චිත්‍රපට ශාලාව, පුස්තකාලය)
- පෙළපොත (පාඩම 32)

**තක්සේරුව හා ඇගයීම**

- තමා හා පවුලේ අය නිවාඩු දිනට යන ස්ථාන පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- නිවාඩු දිනට යන ස්ථාන පිළිබඳ ව විමසමින් සංවාද ගොඩ නගයි.

## ඒකකය 07

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

7.0 ජපන් සමාජය සහ සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

2.5 උචිත නිපාත පද සමග "යයි" "එයි" ක්‍රියාපද භාවිත කරයි.

7.3 ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් මව්බසින් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි**

**ඉගෙනුම් පල**

- විවිධ ප්‍රවාහන මාධ්‍යවල නම් ජපන් බසින් හඳුන්වයි.
- තමා දිනපතා පාසලට එන ආකාරය පිළිබඳ ප්‍රකාශ කරයි.
- තම පවුලේ සාමාජිකයන් දෛනිකව භාවිත කරන ප්‍රවාහන මාධ්‍ය ජපන් බසින් හඳුන්වයි.
- වෙනත් කෙනෙකු දිනපතා පාසලට එන ආකාරය විමසා දැන ගනියි
- ජපානයේ ප්‍රවාහන මාධ්‍යවල පහසුකම් පිළිබඳ ව මව්බසින් විස්තර කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ප්‍රවාහන මාධ්‍යවල නම්
- ජපානයේ ප්‍රවාහන මාධ්‍යවල පහසුකම්
- " යයි" සහ " එයි " ක්‍රියාපද සමග නිපාත පද භාවිතය
- "........... de ikimasu / kimasu " වාක්‍ය රටාව හඳුන්වා දීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 01**

- සිසුන් දිනපතා පාසැලට පැමිණෙන ආකාරය පිළිබඳ මව්බසින් විමසා කලු ලෑල්ලේ සටහන් කරන්න.
- රූප කාඩ් පත් යොදාගෙන එක් එක් ප්‍රවාහන මාධ්‍යයන් ජපන් බසින් හඳුන්වන්න.
- අදාළ වාක්‍ය රටා හඳුන්වා දෙන්න.
- තම යහලුවා පාසැලට පැමිණෙන අයුරු විමසන ආකාරය දෙබස් මගින් පුහුණු කරන්න.

පියවර 02

- ජපානයේ ඇති ප්‍රවාහන මාධ්‍ය පිළිබඳ තොරතුරු ගවේෂණයට අවස්ථාව ලබා දී සිසුන් දන්නා කරුණු ඇසුරින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- පාසලට, රැකියාවට, චාරිකාවකට, බඩු මිල දී ගැනීමට යන අවසථාවල දී ජපන් ජාතිකයින් දෛනිකව භාවිත කරන ප්‍රවාහන මාධ්‍ය පිළිබඳ තොරතුරු සාකච්ජා කරන්න.
- ශ්‍රී ලංකාවේ ප්‍රවාහන මාධ්‍ය සහ පහසුකම් ජපානය සමඟ සන්සන්දනය කරමින් තොරතුරු ගොනු කරන්න.
- ජපානයේ බස් රථවල හෝ දුම්රියේ ගමන් කිරීමේ දී විශේෂයෙන් අනුගමනය කරන ජපන් ජාතිකයින්ගේ පුරුදු සහ රීති පිළිබඳ දැනුවත් කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත ( 33 පාඩම සහ 51 පාඩම)
- රූප කාඩ්පත් (විවිධ ප්‍රවාහන මාධ්‍යයන්)

**තක්සේරුව හා ඇගයීම**

- දෛනිකව භාවිත කරන ප්‍රවාහන මාධ්‍ය පිළිබඳ ව කථා කරයි.
- ජපානයේ සහ ශ්‍රී ලංකාවේ ප්‍රවාහන මාධ්‍යයන් පිළිබඳ ව සසඳමින් අදහස් ප්‍රකාශ කරයි.

**ඒකකය 08**

**නිපුණතාව**

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි
4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි.
6.0 ජපන් භාෂාවෙන් ලබාදෙන පණිවිඩ, තොරතුරු, උපදෙස් සහ සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි.
4.3 තමා පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලියයි.
6.3 සරල සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 02 යි**

**ඉගෙනුම් පල**

- විවේකී දිනවල හෝ ඉදිරි දිනවල කරන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර කරයි.
- විවේකී දිනවල කරන ක්‍රියාකාරකම් කවුරුන් සමඟ කරන්නේදැයි ප්‍රකාශ කරයි.
- ඉදිරි දිනවල කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩනගයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- විවේකී දිනය ගත කරන ආකාරය
- විවිධ ක්‍රියාකාරකම් ජපන් බසින් පැවසීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- විවිධ ක්‍රියාකාරකම් සහිත රූප කාඩ්පත් පෙන්වමින් ජපන් බසින් එම ක්‍රියාකාරකම් හඳුන්වා දෙන්න.
- විවේකී දිනවල දී සිසුන් කරන අමතර ක්‍රියාකාරකම් පිළිබඳ විමසා ජපන් බසින් කලුලෑල්ලේ සටහන් කරන්න.
- අදාළ වාක්‍ය රටා හඳුන්වා දී පෙළපොත ඇසුරින් පුහුණු කරන්න.
- කණ්ඩායම් වශයෙන් වෙන්කර විවේකී දිනවල දී යහලුවන් හා පවුලේ අය සමඟ කිසියම් කටයුත්තක නිරතවීම ප්‍රකාශ කරන ආකාරය සංවාද ඇසුරින් පුහුණු වීමට අවස්ථාව දෙන්න.
- විවේක දිනවල දී සිදුකරන විවිධ ක්‍රියාකාරකම් ලියූ කඩදාසි සිසුන් අතර බෙදා දී එහි සඳහන් ක්‍රියාකාරකමට අනුව මිතුරන් සමග සංවාද ගොඩනගා සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- විවේක දිනය ගත කරන ආකාරය පිළිබඳ කෙටි සටහනක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ ක්‍රියාකාරකම් සහිත රූප කාඩ්පත්
- පෙළ පොත ( 34 පාඩම)

**තක්සේරුව හා ඇගයීම**

- නිවාඩු දින ගතකරන ආකාරය පිළිබඳ වාක්‍ය කිහිපයකින් සරල කථාවක් ඉදිරිපත් කරයි.
- මිතුරන් හෝ පවුලේ සාමාජිකයන් විවේක දිනය ගත කරන ආකාරය පිළිබඳ වාක්‍ය ගොඩ නගා සටහන් කරයි.

ඒකකය 09

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

6.0 ජපන් භාෂාවෙන් ලබා දෙන පණිවිඩ, තොරතුරු, උපදෙස් සහ සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

2.3 තම අත්දැකීම් පිළිබඳ ව ප්‍රකාශ කරයි.

6.3 සරල සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 03 යි**

**ඉගෙනුම් පල**

- තමා විසින් ලබා ඇති විවිධ අත්දැකීම් පිළිබඳ ව පවසයි.
- අන්‍යයන් ලබා ඇති අත්දැකීම් පිළිබඳ ව විමසයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නරඹා ඇති, දැක ඇති සහ රස බලා ඇති දුර්ලභ දේ පිළිබඳ අත්දැකීම් ප්‍රකාශ කිරීම.
- "............ koto ga arimasu "වාක්‍ය රටාව හඳුන්වා දීම.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- දළදා පෙරහැර නැරඹීම, පාර්ලිමේන්තුව නැරඹීම ආදී දුර්ලභ උදාහරණ ප්‍රවේශය සඳහා යොදා ගනිමින් ඒවා නරඹා තිබේදැයි සිසුන්ගෙන් විමසන්න.
- අදාළ ව්‍යාකරණ රටාව හඳුන්වා දෙන්න.
- දැක ඇති දුර්ලභ දේවල්, ස්ථාන, රසබලා ඇති ආහාර ආදි අත්දැකීම් පිළිබඳ ව යහළුවන්ගෙන් විමසා දැන ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ශ්‍රී ලංකාවේ දී කලාතුරකින් රස බැලිය හැකි ආහාර සහ වෙනත් රටවල ආහාර නම් කර ඒවා රස බලා තිබේදැයි සිසුන්ගෙන් විමසා පිළිතුරු ලබා ගන්න.
- සිසුන් කණ්ඩායම් වශයෙන් වෙන් කර පෙළපොතෙහි සඳහන් සංවාද පුහුණු වීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත ( 35 පාඩම )
- විවිධ ආහාර වර්ගවල ඡායාරූප, රූප කාඩ්පත්
- විවිධ ස්ථාන වල ඡායාරූප, රූප කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- ශ්‍රී ලංකාවේ දී සහ විදේශ රටවල දී නරඹා ඇති ස්ථාන පිළිබඳ ව ලද අත්දැකීම් රූප / ඡායාරූප ආදිය ඇසුරින් ප්‍රකාශ කරයි.
- ශ්‍රී ලංකාවේ දී සහ විදේශ රටවල දී රස බලා ඇති ආහාර වර්ග පිළිබඳ ව පවසයි.
- ලබා ඇති අත්දැකීම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගයි.

**වැඩිදුර ගවේෂණය**

- https : // minnokyozai.jp

## ඒකකය 10

**නිපුණතාව**

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි.

4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි.

7.0 ජපන් සමාජය සහ සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි.

4.3 තමා පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලියයි.

7.3 ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් මව්බසින් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි**

**ඉගෙනුම් පල**

- අවුරුදු 1 - 100 දක්වා වූ වයස ජපන් බසින් ප්‍රකාශ කරයි.
- තමාගේ වයස ප්‍රකාශ කිරීමත්, වෙනත් කෙනෙකුගේ වයස විමසීමත් සිදු කරයි.
- තම පවුලේ සාමාජිකයින්ගේ සහ වෙනත් කෙනෙකුගේ පවුලේ සාමාජිකයින්ගේ වයස ප්‍රකාශ කරයි
- ජපන් ජාතිකයින්ගේ ජීවිතයේ වැදගත් සිදුවීම් පිළිබඳ ව සරල ව විස්තර කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වයස ප්‍රකාශ කිරීම
- " ........... sai desu" වාක්‍ය රටාව
- ජපන් ජාතිකයන්ගේ ජීවිතයේ වැදගත් සිදුවීම් පිළිබඳ ව තොරතුරු
- තමා සහ පවුලේ සාමාජිකයන් පිළිබඳ තොරතුරු අඩංගු කෙටි විස්තරයක්

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

පියවර 1

- මෙතෙක් උගත් 1-100 දක්වා සංඛ්‍යා සටහන් කර ඇති කාඩ්පත් භාවිතා කර, අහඹු ලෙස තෝරාගත් සංඛ්‍යා පෙන්වා ජපන් බසින් විමසමින් පාඩමට පිවිසෙන්න.
- ඉලක්කමින් වයස සඳහන් කරන ලද ළදරුවෙකුගේ රූපයක්, පාසල් ශිෂ්‍යයෙකුගේ රූපයක්. තරුණයකුගේ රූපයක් හා වයසක පුද්ගලයෙකුගේ රූපයක් පෙන්වමින් " sai " පසු යෙදුම් යොදා වයස ප්‍රකාශ කරන වාක්‍ය රටාව පන්තියට ඉදිරිපත් කරන්න. " sai " යන පසු යෙදුමේ අර්ථය අනුමාන කොට අවබෝධ කර ගැනීමට සලස්වන්න.
- අදාළ ව්‍යාකරණ රටාව හඳුන්වා දෙන්න.
- පෙළපොත ඇසුරින් දී ඇති සංවාද පුහුණු කරන්න.
- පෙළපොතෙහි සඳහන් විවිධ පාඩම් මට්ටම් ලියූ කාඩ්පත් ඇසුරින් " sai " පසුයෙදුම යොදා වයස ප්‍රකාශ කිරීමට උපදෙස් ලබාදෙන්න.
- මෙතෙක් ලබා ඇති දැනුම ආශ්‍රයෙන් තමා සහ පවුලේ සාමාජිකයින් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

පියවර 11

- පෙළපොත ඇසුරින් ජපන් ජාතිකයින්ගේ ජීවිතයේ වැදගත් අවස්ථා හඳුන්වා දී සාකච්ඡා කරන්න.
- " seijin no hi " සහ " shichi no go san " වැනි විශේෂිත උත්සව පිළිබඳ තොරතුරු සොයා බැලීමට සිසුන්ට යොමු කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- 1- 100 දක්වා සංඛ්‍යා ලියූ කාඩ්පත්
- පවුලක ඡායාරූප /රූප
- පෙළපොත ( 36 පාඩම සහ 53 පාඩම)

**තක්සේරුව හා ඇගයීම**

- රූප කාඩ් පත් ඇසුරෙන් ගුරුවරයා විමසන වයස නිවැරදි ව ප්‍රකාශ කරයි.
- පවුලේ සාමාජිකයන්ගේ වයස ප්‍රකාශ කරයි.

**ඒකකය 11**

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි.

**නිපුණතා මට්ටම**

2.2 තම බලාපොරොත්තු, අවශ්‍යතා සහ කැමැත්ත ප්‍රකාශ කරයි.

4.3 තමා පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලියයි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- අනාගතයේ දී තමා නිරත වීමට කැමති රැකියාව පිළිබඳ ව පවසයි.
- විවිධ රැකියා ජපන් බසින් හඳුන්වයි.
- අන්‍යයන් ප්‍රිය කරන රැකියාව පිළිබඳ ව විමසා දැන ගනියි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- විවිධ රැකියා ජපන් බසින් හඳුන්වා දීම.
- ප්‍රිය කරන රැකියා පිළිබඳ කථා කිරීම හා සංවාද ගොඩනැගීම
- " ........... ni nari tai desu" වාක්‍ය රටාව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සිසුන් ප්‍රියකරන රැකියා පිළිබඳ ව විමසමින් ප්‍රවේශයක් ලබා ගන්න.
- විවිධ රැකියා සහිත පින්තූර හෝ රූප කාඩ්පත් ප්‍රදර්ශනය කරමින් එක් එක් රැකියාවලට අදාළ වචන මාලාව ජපන් බසින් හඳුන්වා දෙන්න.
- අදාළ වාක්‍ය රටාව හඳුන්වා දී ඊට අදාල වචන මාලාව ඇසුරින් එක් එක් සිසුන් අනාගතයේ දී නිරත වීමට කැමති රැකියාව පිළිබඳ වාක්‍ය ගොඩනැගීමටත් සංවාද පුහුණු වීමටත් උපදෙස් දෙන්න.
- රැකියා ඇසුරින් නිරමාණාත්මක ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න.
  උදා:- විවිධ රැකියාවල සටහන් කරන ලද කාඩ්පත් කිහිපයක් අතුරින් එක් කාඩ්පතක් තෝරාගෙන එය තෝරාගත් සිසුවා කාඩ් පතෙහි සඳහන් රැකියාව අභිනයෙන් දැක්වීම සහ අනෙක් සිසුන් අනුමාන කර නිවැරදි පිළිතුර ජපන් බසින් පැවසීම
- මෙතෙක් ලබා ඇති දැනුම ඇසුරෙන් තම බලාපොරොත්තු ප්‍රිය කරන ක්‍රීඩාව, පුද්ගලයා, රැකියාව, ආදී කරුණු ඇතුළත් විස්තරයක් ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත (37 පාඩම)
- විවිධ රැකියාවල් ඇතුළත් රූප කාඩ් පත්
- විවිධ රැකියාවල නම් සටහන් කරන ලද කාඩ් පත්

**තක්සේරුව හා ඇගයීම**

- අනාගතයේ දී නිරත වීමට කැමති රැකියාව ජපන් බසින් පවසයි.
- විවිධ රැකියා ජපන් බසින් නම් කරයි.

**වැඩිදුර ගවේෂණය**

- https : // minnokyozai.jp

## ඒකකය 12

**නිපුණතාව**

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි

4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි.

**නිපුණතා මට්ටම**

3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි.

4.3 තමා පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලියයි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- පාසල් පරිශ්‍රයෙහි ඇති විවිධ ස්ථාන සහ ගොඩනැගිලි ජපන් බසින් නම් කරයි.
- පාසල් භූමියෙහි ඇති විවිධ ගොඩනැගිලි නම්කර ඒවා පිහිටා ඇති ස්ථානය විමසා දැන ගනියි.
- විවිධ භාණ්ඩ අලෙවි සැල් ජපන් බසින් හඳුන්වයි.
- විවිධ භාණ්ඩ අලෙවි සැල් පිහිටා ඇති ස්ථාන විමසා දැන ගනියි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පාසල් භූමියෙහි පිහිටා ඇති විවිධ ගොඩනැගිලි හා ස්ථාන ජපන් බසින් නම් කරයි.
- විවිධ ස්ථාන පිහිටීම පිළිබඳ විමසා දැනගැනීම
- " .................. doko ni arimasuku" වාක්‍ය රටාව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- විශාල ව අඳින ලද තම පාසැලේ දළ සිතියමක් පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න. (කාර්යාලය, භෝජනාගාරය, පුස්තකාලය ආදී පොදු ස්ථාන විශේෂයෙන් දැක්විය යුතුයි)
- එක් එක් ස්ථානය ජපන් බසින් හඳුන්වා දෙමින් සිසුන්ට මතක තබා ගැනීමට අවස්ථාවක් ලබාදෙන්න.
- එක් එක් ස්ථානය පිහිටා ඇති ගොඩනැගිල්ල සහ කී වෙනි මහලේ පිහිටා තිබේ ද යන්න ප්‍රකාශ කරන වාක්‍ය රටා හඳුන්වා දෙන්න.
- සිතියමේ විවිධ ස්ථාන දක්වමින් පිහිටා ඇති ස්ථානය එක් එක් සිසුවාගෙන් විමසමින් පිළිතුරු ලබා ගන්න.
- පාසලේ පිහිටා ඇති ස්ථාන වලට අමතරව විවිධ අලෙවි සැල් හඳුන්වන නම් ජපන් බසින් හඳුන්වා දී පෙළපොත ඇසුරින් සංවාද පුහුණු වීමට යොමු කරන්න.
- තම පාසල පිළිබඳ ව පේළි කිහිපයකින් විස්තරයක් ලිවීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත (38 පාඩම)
- පාසලේ විවිධ ස්ථාන සහ ගොඩනැගිලි විශාල කර ඇඳ, නම් කරන ලද සිතියමක්

**තක්සේරුව හා ඇගයීම**

- පාසල් භූමියෙහි ඇති විවිධ ගොඩනැගිලි පිහිටා ඇති ස්ථාන දැන ගැනීම සඳහා සංවාද ගොඩනගයි.
- පාසල් පරිශ්‍රයෙහි සහ පිටත විවිධ ස්ථාන සහ අලෙවි සල් ජපන් බසින් නම් කරයි.

**වැඩිදුර ගවේෂණය**

- https : // minnokyozai.jp

## ඒකකය 13

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

7.0 ජපන් සමාජය සහ සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

2.1. තමන් ප්‍රියකරන දේවල් පිළිබඳ ප්‍රකාශ කරයි.

7.3 ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් මව් බසින් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 03 යි**

**ඉගෙනුම් පල**

- වඩාත් ම කැමති දෙය සහ කැමති පුද්ගලයා පිළිබඳ ව පවසයි.
- අන්‍යයන් වඩාත් ම කැමති දෙය සහ කැමති පුද්ගලයා පිළිබඳ ව විමසයි.
- ජපානයේ යොවුන් පරපුර ප්‍රියකරන විලාසිතා, සංගීතය සහ වැඩසටහන් පිළිබඳ ව මව් බසින් අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වඩාත් ම ප්‍රියකරන දේවල් / පුද්ගලයා පිළිබඳ ව කතා කිරීම
- ජපානයේ යොෟවුන් පරපුර ප්‍රියකරන දේ පිළිබඳ තොරතුරු

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 01**

- සිසුන්ට විවිධ ක්‍රීඩාවල රූප කාඩ්පත් පෙන්වමින් එම ක්‍රීඩාවල නම් මතක තබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන්න.
- මව්බසින් සිසුන් වඩාත් ම කැමති ක්‍රීඩාව විමසන්න.
- වඩාත් ම කැමති ක්‍රීඩාව ප්‍රකාශ කිරීමට අදාළ ව්‍යාකරණ රටාව හඳුන්වා දෙන්න.
- ක්‍රීඩා කිහිපයක් නම් කර ඒ අතරින් වඩාත් කැමති ක්‍රීඩාව ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- වඩාත් කැමති ගායකයා හෝ ගායිකාව සහ වඩාත් කැමති ස්ථානය පිළිබඳ යහළුවන්ගෙන් විමසා සටහන් කර ගැනීමට උපදෙස් ලබාදෙන්න.

**පියවර 02**

- ජපන් ජාතික යොවුන් පුරපුර ප්‍රියකරන විලාසිතා , සංගීත වැඩසටහන්, පොතපත පිළිබඳ තොරතුරු අන්තර්ජාලය හෝ පොත් පත් ඇසුරින් සොයා බැලීමට උපදෙස් ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් කර රැස්කර ගත් කරුණු ඇසුරින් ජපානයේ යොවුන් පරපුර ප්‍රියකරන දේවල් පිළිබඳ ව බ්‍රිස්ටල් බෝඩ් හෝ ඩිමයි කඩදාසිවල රූප සටහන් සහිත ව කරුණු ගොනු කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් කණ්ඩායමට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දී සිසුන්ගේ අදහස් විමසමින් සාකච්ජා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත (39 පාඩම 52 පාඩම)
- රූප කාඩ්පත් (විවිධ ක්‍රීඩා, ගායකයින්, නළු නිළියන්, ස්ථාන, ආහාර )
- බ්‍රිස්ටල් බෝඩ් හෝ ඩිමයි කඩදාසි

**තක්සේරුව හා ඇගයීම**

- වඩාත් කැමති ආහාරය, රට, නළුවා හෝ නිළිය, ක්‍රීඩකයා පිළිබඳ ව ඡායරූප පෙන්වා එයට වඩාත් ම ප්‍රියකරන බව ප්‍රකාශ කරයි.
- යහළුවන් වඩාත් කැමති ආහාරය, රට, නළුවා හෝ නිළිය, ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව පිළිබඳ ව විමසා සටහන් කරයි.
- ජපානයේ යොවුන් පරපුර ප්‍රියකරන විලාසිතා, සංගීතය ආදිය පිළිබඳ මව්බසින් විස්තර කරයි.

**වැඩිදුර ගවේෂණය**

- https : // minnokyozai.jp

**ඒකකය 14**

**නිපුණතාව**

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි

7.0 ජපන් සමාජය සහ සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි.

7.2 ජපන් ජාතිකයන් සමඟ සාර්ථක ව අදහස් හුවමාරුකර ගැනීමට සහ ජපන් සමාජයට හැඩ ගැසීමට අවශ්‍ය කරුණු අවබෝධ කර ගනියි.

7.3 ශ්‍රී ලංකාවේ සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් මව් බසින් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 04 යි**

**ඉගෙනුම් පල**

- අංක 100-1000 දක්වාත් 1000 - 10,000 දක්වාත් ගණන් කරයි.
- භාණ්ඩයක මිල විමසීම සහ මිල ප්‍රකාශ කිරීම සිදුකරයි.
- වෙනත් කෙනෙකු සතු භාණ්ඩයක මිල විමසා දැන ගෙන ඒ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- ජපන් ජාතිකයින් හා ශ්‍රී ලාංකිකයන් එදිනෙදා ජීවිතයේ දී බඩු මිල දී ගැනීම් සිදුකරන ආකාරය පුරුදු හා ස්ථාන පිළිබඳ සසඳමින් මව්බසින් අදහස් ප්‍රකාශ කරයි.
- වෙළඳ සැලකින් බඩු මිලදී ගැනීම සඳහා අවශ්‍ය සරල සංවාද ගොඩනගයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අංක 100 - 10000 අතර සංඛ්‍යා
- ජපන් ජාතිකයින් භාණ්ඩ මිල දී ගැනීමේ දී දක්නට ලැබෙන චර්යා සහ පුරුදු පිළිබඳ තොරතුරු
- වෙළඳ සැලකින් භාණ්ඩ මිල දී ගැනීම සඳහා අවශ්‍ය සංවාද සහ ප්‍රකාශන ක්‍රම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

පියවර 1

- සැබෑ මුදල් නෝට්ටු කිහිපයක් ඉදිරිපත් කරමින් පාඩමට ප්‍රවේශ වන්න.
- සංඛ්‍යාවලට පසුව මුදල් ඒකකය (rupi, doru, en ) යෙදීමෙන් භාණ්ඩයක මිල ප්‍රකාශ කළ හැකි බව පවසන්න.
- 100-1000 දක්වාත් 1000 - 10000 දක්වාත් ගණන් කරන ආකාරය අංක කාඩ්පත් ඇසුරින් පෙන්වා දෙන්න.
- රීතියෙන් වෙනස් වන විශේෂ අවස්ථා කෙරෙහි සිසු අවධානය යොමු කරවන්න.

  300 sanbyaku    800 happyaku    8000 hassen

  600 hoppyaku    3000 sanzen
- සංඛ්‍යා ලියූ කාඩ්පත් ඇසුරින් විවිධ මුදල් ඒකක භාවිත කර අභ්‍යාසයේ යොදවන්න.

පියවර 2

- භාණ්ඩයක මිල විමසන ආකාරය සංවාද ඇසුරින් පුහුණු කරන්න.
- වෙනත් කෙනෙකු සතු දෙයක මිල විමසා, ඒ පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පන්තිය තුළ වෙළඳ පොලක් නිර්මාණය කර පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදී එක් කණ්ඩායමක් වෙළෙඳ සේවකයින් ලෙසත්, අනෙක් කණ්ඩායම බඩු මිල දී ගන්නන් ලෙසත් ක්‍රියා කරමින් භාණ්ඩවල මිල විමසමින් බඩු මිල දී ගැනීමට උපදෙස් දෙන්න. ඉන්පසු එකිනෙකා මිල දී ගත් බඩුවල මිල පිළිබඳ විමසමින් අගය කරමින් අදහස් ප්‍රකාශ කරමින් සංවාද ගොඩ නැගීමට උපදෙස් දෙන්න.

පියවර 3

- ශිෂ්‍යයන් දන්නා කරුණු ඇසුරින් ජපන් ජාතිකයින් එදිනෙදා ජීවිතයේ දී බඩු මිල දී ගැනීම් සිදුකරන ආකාරය පිළිබඳ සාකච්ජාවක් මෙහෙයවන්න.
- ජපානයේ ඇති විශේෂ කඩසාප්පු ගැන හඳුන්වා දෙන්න.

  උදා 100en shop, yaoya, supa, kombini
- ඩී.වී.ඩී. හෝ ඡායාරූප භාවිත කරමින් එම කඩසාප්පුවල ඇති සුවිශේෂී බව සාකච්ජා කරන්න.
- ශ්‍රී ලාංකිකයන් බඩු මිල දී ගන්නා ආකාරය සහ ශ්‍රී ලංකාවේ කඩසාප්පු සමඟ සන්සන්දනය කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- 1 - 10 000 අතර සංඛ්‍යා ලියන ලද කාඩ් පත් කිහිපයක්
- භාණ්ඩවල මිල ගණන් දැක්වෙන පත්තර, සඟරා
- මිල සඳහන් ව ඇති ඇසුරුම්, පැකට්, බෝතල්
- සැබෑ මුදල් නෝට්ටු
- ජපානයේ බඩු මිල දී ගැනීම පිළිබඳ දැක්වෙන ඩී.වී.ඩී.
- ජපානයේ වෙළඳ සැල්වල ඡායාරූප

**තක්සේරුව හා ඇගයීම**

- ජපන් සඟරාවක දැක්වෙන විවිධ භාණ්ඩවල මිල ප්‍රකාශ කරයි.
- " Ikura desuka" භාවිත කරමින් විවිධ අවස්ථාවලට අදාළ ව සංවාද ගොඩ නගයි.

  උදා:- තැපැල් කාර්යාලයේ දී ලියුම් කවර, මුද්දරවල මිල විමසා මිල දී ගැනීම,
  පළතුරු වෙළෙඳ සැලකින් පලතුරු මිල දී ගැනීම.

**ඒකකය 15**

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

6.0 ජපන් භාෂාවෙන් ලබා දෙන පණිවිඩ, තොරතුරු, උපදෙස් සහ සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

2.2 තම බලාපොරොත්තු, අවශ්‍යතා සහ කැමැත්ත ප්‍රකාශ කරයි.

6.3 සරල සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- තමන් එදිනෙදා පරිහරණය කරන උපකරණ හා භාණ්ඩ ජපන් බසින් නම් කරයි.
- තමන්ට අවශ්‍ය ව ඇති භාණ්ඩ හා උපකරණ පිළිබඳ ව පවසයි.
- අනන්‍යයන්ට අවශ්‍ය ව ඇති භාණ්ඩ පිළිබඳ ව විමසා දැන ගනියි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- එදිනෙදා පරිහරණය කරන භාණ්ඩ ජපන් බසින් හඳුන්වා දීම
- " ............... ga hoshi desu " වාක්‍ය රටාව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- භාණ්ඩයක් /උපකරණයක් අවශ්‍ය බව පැවසීම සඳහා අදාළ වාක්‍ය රටාව හඳුන්වා දී, ඒ ඇසුරින් සිසුන්ට අයත් විවිධ භාණ්ඩ ප්‍රදර්ශනය කරමින් එම භාණ්ඩ තමන්ට අවශ්‍ය බව පැවසීම සඳහා වාක්‍ය ගොඩ නගන්න.
- සිසුන් සතු විවිධ භාණ්ඩ ජපන් බසින් හඳුන්වා දී කළු ලැල්ලේ සටහන් කරන්න.
- ප්‍රශ්නවාචී වාක්‍ය රටාව ඇසුරින් සිසුන්ට අවශ්‍ය භාණ්ඩ පිළිබඳ ව ප්‍රශ්න අසමින් පිළිතුරු ලබාගන්න.
- පෙළපොත ඇසුරින් සංවාද වැඩිදුරටත් පුහුණු වීමට අවස්ථා ලබාදෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත (41 පාඩම)

**තක්සේරුව හා ඇගයීම**

- විවිධ භාණ්ඩ නම් කරමින් ඒවා තමන්ට අවශ්‍ය බව කියයි.
- අන්‍යයන්ට අවශ්‍ය භාණ්ඩ පිළිබඳ ව විමසා දැන ගනියි.

## ඒකකය 16

**නිපුණතාව**

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි.

6.0 ජපන් භාෂාවෙන් ලබා දෙන පණිවිඩ, තොරතුරු, උපදෙස් සහ සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි.

6.2 දෛනික ජීවිතයට අවශ්‍ය පණිවුඩ, තොරතුරු සහ උපදෙස්වලට සවන් දී අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 04 යි.**

**ඉගෙනුම් පල**

- අවුරුද්දේ මාස 12 ජපන් බසින් නම් කර පිළිවෙළින් පවසයි.
- මාසයේ දින ජපන් බසින් කියයි.
  උදා: පළවෙනි දා, දෙවෙනිදා, තුන්වෙනිදා
- තමා උපන් මාසය සහ දිනය පවසයි.
- මිතුරන්ගේ උපන් දිනය විමසා දැන ගනියි.
- උපන්දිනය සඳහා සුභ පතයි, සුභ පැතුම් සඳහා ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- මාස 12 ජපන් බසින් හැඳින්වීම
- මාසයේ දින ජපන් බසින් හැඳින්වීම
- උපන් දිනය සඳහා සුභ පැතීම, ප්‍රතිචාර දැක්වීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- මාස 12 සිංහල බසින් සහ ජපන් බසින් විශාල කර ලියන ලද ඩිමයි කඩදාසියක් පන්තියේ ප්‍රදර්ශනය කර හඬ නගා කියවමින් පුහුණුවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- මාසයේ දින සටහන් ව ඇති දින දර්ශනයක කොළයක් භාවිත කර මාසයේ දින ජපන් බසින් හඳුන්වා දෙන්න.
- මාසයේ දින මතක තබා ගැනීමට පහසු වන ලෙස නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් කරන්න.
- මාසය හා දිනය ඉලක්කමෙන් ලියන ලද කාඩ්පත් ප්‍රදර්ශනය කරමින් එය ජපන් බසින් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- කණ්ඩායම් දෙකකට වෙන් කර නිවැරදි ව මාසය සහ දිනය පවසන කණ්ඩායමට ලකුණු ලබා දී අවසානයේ ජයග්‍රාහී කණ්ඩායම නම් කරන්න.
- මාසය සහ දිනය ජපන් බසින් මතකයෙන් පැවසීමට ප්‍රමාණවත් පුහුණුවක් ලැබූ පසු උපන්දිනය විමසීම සඳහා අදාළ වාක්‍ය රටාව හඳුන්වා දෙන්න.
- පෙළපොත සහ අතිරේක උදාහරණ ඇසුරින් සංවාද ගොඩනැගීමට උපදෙස් ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත (42 පාඩම )
- මාස 12 විශාල අකුරෙන් ලියූ ඩිමයි කඩදාසියක්
- දින දර්ශනයක කොළයක්
- මාසය සහ දිනය ඉලක්කමෙන් ලියූ කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- මාස 12 නිවැරදි ව අනුපිළිවෙළින් ජපන් බසින් පවසයි.
- මාසයේ දින ජපන් බසින් හඳුන්වයි.
- තම උපන් දිනය පවසයි, මිතුරන්ගේ උපන්දිනය පිළිබඳ ව විමසා දැන ගනියි.
- උපන් දිනයට සුභ පතයි.

## ඒකකය 17

**නිපුණතාව**

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි
4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි.
6.0 ජපන් භාෂාවෙන් ලබා දෙන පණිවිඩ, තොරතුරු, උපදෙස් සහ සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

3.1 යම් කාර්යයක් කිරීම සඳහා අන්‍යයන්ගේ කැමැත්ත සහ අවසරය ලබාගනියි.
4.4 යමක් සඳහා අවසර ලබාගැනීම සහ ආරාධනා කිරීම ලිඛිත ව සිදුකරයි.
6.3 සරල සංවාදවලට සවන් දී අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම්පල**

- යම්කිසි ක්‍රියාවක් සිදුකිරීම සඳහා අවසර ගැනීම හා නිවැරදි ව ප්‍රතිචාර දැක්වීම කරයි.
- යමකට අවසර ලබාගැනීම ලිඛිත ව සිදු කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- යම් ස්ථානයකට යෑම, අන්‍යයන්ට අයත් දෙයක් ලබා ගැනීමට අවසර ගැනිම
- " ....................te mo ii desuka " වාක්‍ය රටාව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ආපන ශාලාව, පුස්තකාලය, වැසිකිළිය ආදී පාසල තුළ තිබෙන ස්ථානවල නම් රූප කාඩ්පත් ඇසුරෙන් හඳුන්වා දෙන්න.
- යම් ස්ථානයකට යෑම සඳහා අවසර ගැනීමේ දී භාවිත කරන වාක්‍ය රටාව හඳුන්වා දෙන්න.
- යමකට අවසර ඉල්ලීමේ දී ප්‍රතිචාර දැක්වීම සඳහා භාවිතා වන ප්‍රකාශන විධි හඳුන්වා දෙන්න.
- යම් ස්ථානයකට යෑම සඳහා ගුරුවරයාගෙන් අවසර ගන්නා අයුරු සංවාද ඇසුරෙන් පුහුණු කරවන්න.
- විවිධ අවශ්‍යතා සඳහා අවසර ගන්නා ආකාරය සංවාද ඇසුරින් තවදුරටත් පුහුණු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත (43 පාඩම)
- රූප කාඩ් පත් (විවිධ ස්ථාන සහ උපකරණ)

**තක්සේරුව හා ඇගයීම**

- දළදා මාළිගාව ආදී ස්ථානයක දී කළ හැකි ක්‍රියා සඳහා අවසර ගනියි.
- යම් කාර්යයක් කිරීම සඳහා ජපන් බසින් අවසර ලබා ගනියි.

## ඒකකය 18

**නිපුණතාව**

3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි.
4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි.

**නිපුණතා මට්ටම**

3.2 යම් කාර්යයක් කිරීම සඳහා ආරධනා කරයි.
3.3 ප්‍රශ්නවාචී පද භාවිත කරමින් තොරතුරු විමසයි.
4.4 යමක් සඳහා අවසර ලබාගැනීම සහ ආරාධනා කිරීම ලිඛිත ව සිදුකරයි.

**කාලච්ඡේද 03 යි.**

**ඉගෙනුම් පල**

- නිවාඩු දිනක යම් ක්‍රියාවක් කිරීමට මිතුරන්ට ආරාධනා කරයි.
- මිතුරන් කරන ආරාධනාවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- යම් කාර්යයක් කිරීම සඳහා අන්‍යයන්ට ආරාධනා කිරීම
- ආරාධනාවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරිම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

පියවර 1

- නිවාඩු දිනක යහළුවාට යම් ක්‍රීඩාවක යෙදීමට ආරාධනා කරන ආකාරය පුහුණු කිරීම සඳහා එම ක්‍රීඩාවේ රූප කාඩ්පතක් ඉදිරිපත් කරමින් පාඩමට පිවිසෙන්න. ගුරුවරයා ජපන් බසින් දෙබස ඉදිරිපත් කරන්න. (රූප කාඩ්පත් කිහිපයක් යොදා ගැනීම වඩා යෝග්‍ය වේ.)
- දෙබසෙහි අදහස සිසුන්ට වටහා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- නිවාඩු දිනට සාමාන්‍යයෙන් යහළුවන් සමග කුමන ආකාරයේ ක්‍රියාකාරකම් කරන්නේ දැයි සිසුන්ගෙන් විමසන්න. සිසු පිළිතුරු කළු ලෑල්ලේ සටහන් කරන්න.
- ඉහත පිළිතුරුවලට අමතර ව ජපන් ජාතික සිසුන් නිවාඩු දිනට යහළුවන් සමඟ සිදුකරන ක්‍රියාකාරකම් ජපන් බසින් කලු ලෑල්ලේ සටහන් කරන්න.
- අදාළ ව්‍යාකරණ රටාව හඳුන්වා දී විවිධ රූප කාඩ්පත් ප්‍රදර්ශනය කරමින් වාක්‍ය රටාව පුහුණු කරවන්න.
- මෙතෙක් ඉගෙන ගෙන ඇති ක්‍රියා පදවල " masu" ස්වරූපය ලියු කාඩ්පත් ප්‍රදර්ශනය කරමින් එම ක්‍රියාපද වල " masen " ස්වරූපය සකස් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ක්‍රියා පදවලට පෙර යෙදිය යුතු නිපාත පදය කෙරෙහි සිසු අවධානය යොමු කරවන්න.

පියවර 2

- සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර නිවාඩු දිනක යම් ක්‍රියාවක් කිරීමට ආරාධනා කිරීම සඳහා සංවාද ගොඩනගා පුහුණු කරන්න.
- ආරාධනාවක් පිළිගන්නා ආකාරය දක්වෙන රූප කාඩ්පත් හා ආරාධනාවක් ප්‍රතික්ෂේප කරන ආකාරය දක්වෙන රූප කාඩ්පත් යොදා ගෙන ආරාධනාවක් පිළිගන්නා ආකාරය හා ප්‍රතික්ෂේප කරන ආකාරය සංවාද ඇසුරින් පුහුණු කරන්න.

**තක්සේරුව හා ඇගයීම**

- නිවාඩු දිනයක යම් කටයුත්තක යෙදීමට යහළුවන්ට ආරාධනා කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- රූප කාඩ්පත්
- ක්‍රියා පද ලියු කාඩ්පත් ( ~ masu ස්වරූපය)

**ඒකකය 19**

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.
4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි.

**නිපුණතා මට්ටම**

2.1. තමන් ප්‍රියකරන දේවල් පිළිබඳ ප්‍රකාශ කරයි.
4.3 තමා පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලියයි.

**කාලච්ඡේද 04 යි.**

**ඉගෙනුම් පල**

- පුද්ගලයන්ගේ ගති ලක්ෂණ විස්තර කිරීම සඳහා අවශ්‍ය විශේෂණ පද ගොනු කරයි.
- ප්‍රිය කරන පුද්ගලයන්ගේ ගති ලක්ෂණ පවසයි.
- ප්‍රිය කරන පුද්ගලයන්ගේ දක්ෂතා පවසයි.
- ප්‍රිය කරන පුද්ගලයන් පිළිබඳ කෙටි සටහනක් පිළියෙල කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පුද්ගල ගතිගුණ විස්තර කරන විශේෂණ පද
- පුද්ගල හැකියා සහ දක්ෂතා

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- පන්තියේ එක් එක් සිසුන් ප්‍රියකරන පුද්ගලයාගේ ගති ලක්ෂණ හා දක්‍ෂතා මව්බසින් විමසමින් පාඩමට ප්‍රවේශයක් ලබා ගන්න.
- ගති ලක්ෂණ ප්‍රකාශ කිරීමට භාවිත කරන විශේෂණ පද හඳුන්වා දෙන්න.
- සිසුන් සඳහන් කළ පුද්ගල හැකියා සහ දක්‍ෂතා ගොනු කොට කළු ලෑල්ලේ ජපන් බසින් සටහන් කරන්න.
- පෙළපොතෙහි දී ඇති වාක්‍ය රටා ඇසුරින් පුද්ගල ගති ලක්ෂණ සහ දක්ෂතා ප්‍රකාශ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ගති ලක්ෂණයක් සහ පුද්ගල දක්ෂතාවක් සඳහන් කාඩ්පත් සිසුන් අතර බෙදා දී ඊට අනුකූල ව වාක්‍ය ගොඩ නගමින් කළු ලෑල්ලේ සටහන් කිරීමට උපදෙස් ලබා දෙන්න.
- තමා ප්‍රිය කරන පුද්ගලයාගේ රූප සටහනක් සමග ගති ලක්ෂණ හා දක්ෂතා සඳහන් කරන ලද කාඩ්පතක් සකස් කර පන්තියට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන්න.
- ඒ ඇසුරින් ප්‍රශ්න අසමින් සංවාද ගොඩනැගීමට යොමු කරන්න.
- තමා ප්‍රියකරන පුද්ගලයා පිළිබඳ තොරතුරු ඇතුළත් කෙටි විස්තරයක් ලිවීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත (45 පාඩම )
- පුද්ගල ගති ලක්ෂණ සහ දක්ෂතා ලියන ලද කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- තමා ප්‍රියකරන පුද්ගලයාගේ ගති ලක්ෂණ හා දක්ෂතා පිළිබඳ කෙටි විස්තරයක් පවසයි.
- තම පවුලේ සාමාජිකයින්ගේ ගති ලක්ෂණ හා දක්ෂතා විස්තර කරයි.

**ඒකකය 20**

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.

4.0 ජපන් බසින් කෙටි සටහන්, පණිවිඩ සහ තොරතුරු ලියයි.

**නිපුණතා මට්ටම**

2.4 ක්‍රියා පදවල සරල අතීත කාල ස්වරූපය භාවිත කර තමන් විසින් කරන ලද කාර්යයන් ප්‍රකාශ කරයි.

4.3 තමා පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලියයි.

**කාලච්ඡේද 04 යි.**

**ඉගෙනුම් පල**

- නිවාඩු දිනයේ දී කරන ලද කාර්ය පිළිබඳ පවසයි.
- අතීතයේ දී කරන ලද ක්‍රියා ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ක්‍රියා පදවල සරල අතීත කාලය

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- " masu" ස්වරූපයේ ක්‍රියාපද ලියූ කාඩ්පත් සිසුන්ට ප්‍රදර්ශනය කරමින් ඊට අදාළ " mashita" ස්වරූපය ලියූ කාඩ්පත් පෙන්වමින් ක්‍රියා පදයක සරල අතීත කාලය සකස් කිරීම පිළිබඳ ව සිසුන්ට අදහසක් ලබා දෙන්න.
- සරල වාක්‍ය ගොඩනැගීම සඳහා අවශ්‍ය නාම පද හා ක්‍රියා පදවලට අදාල රූප කාඩ්පත් පෙන්වමින් සිසුන් ලවා වාක්‍ය ගොඩ නගන්න උදා :- පොතක රූපයක් සහ කියවීමේ ඉරියව්ව සහිත රූප කාඩ්පතක්
- නිවාඩු දිනයේ දී සිසුන් නිරත වූ කාර්ය පිළිබඳ ව විමසමින් පිළිතුරු ලබා ගන්න.
- සිසුන් නිරත වූ කාර්ය පිළිබඳ සංවාද ගොඩ නගමින් පුහුණු වීමට උපදෙස් දෙන්න.
- නිවාඩු දිනයේ නිරත වූ විවිධ ක්‍රියා අඩංගු සටහනක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත (46 පාඩම )
- රූප කාඩ්පත්
- ක්‍රියා පද ලියන ලද කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- තම නිවාඩු දිනයේ දී කරන ලද කාර්ය කෙටියෙන් පවසයි.
- අන්‍යයන් නිවාඩු දිනය ගත කළ ආකාරය විමසා දැනගනියි.
- සරල අතීත කාල ස්වරූපයට අනුව වාක්‍ය ගොඩ නගයි.
- නිවාඩු දිනය ගත කළ ආකාරය පිළිබඳ කෙටි වාක්‍ය ලියයි.

**ඒකකය 21**

**නිපුණතාව**

2.0 තමන් පිළිබඳ ව වඩාත් විස්තරාත්මක ව ජපන් බසින් ප්‍රකාශ කරයි.
3.0 දෛනික ක්‍රියාකාරකම් පිළිබඳ ව සරල සංවාද ගොඩ නගමින් අදහස් හුවමාරු කර ගනියි
7.0 ජපන් සමාජය සහ සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

24 ක්‍රියා පදවල සරල අතීත කාල ස්වරූපය භාවිත කර තමන් විසින් කරන ලද කාර්ය ප්‍රකාශ කරයි.
2.5 උචිත නිපාත පද සමඟ "යයි" "එයි" ක්‍රියා පද භාවිත කරයි.
3.4 වෙනත් කෙනෙකු සතු දෙයක් අගය කරමින් තම අදහස් ප්‍රකාශ කරයි.
7.3 ශ්‍රී ලංකාව සහ ජපානය අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන තම අදහස් මව්බසින් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 03 යි**

**ඉගෙනුම් පල**

- තම නිවාඩු දිනවල දී විවේකය ගත කළ ආකාරය පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- නිවාඩුවට කළ දේ පිළිබඳ ව යහළුවන්ගෙන් විමසා දැන ගනියි.
- විශේෂණ පද ඇසුරින් තම අදහස් හා හැඟීම් පල කරයි.
- ජපන් ජාතික සිසුන් දෛනික ව මුදල් වියදම් කරන ආකාරය හා ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ ව කෙටියෙන් විස්තර කරයි
- ශ්‍රී ලංකාවේ සහ ජපානයේ පාසල් සිසුන්ගේ දෛනික මුදල් අවශ්‍යතා පිළිබඳ සන්සන්දනය කරමින් අදහස් පළ කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිවාඩු දිනවල දී කරන කාර්ය විස්තර කිරීම.
- විශේෂණ පද භාවිත කරමින් හැඟීම් / අදහස් පලකිරීම.
- ජපන් ජාතික සිසුන්ගේ දෛනික මුදල් අවශ්‍යතා හඳුනා ගැනීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

**පියවර 1**

- සිසුන් තම නිවාඩු දිනය සහ විවේකය ගත කළ ආකාරය පිළිබඳ ව විමසන්න.
- අදාළ වාක්‍ය රටාව හඳුන්වා දී නිවාඩුව /විවේකය පිළිබඳ ව අදහස් පවසන අයුරු පුහුණු කරවන්න.
- පෙළපොත ඇසුරින් යහළුවා නිවාඩුව ගත කළ ආකාරය පිළිබඳ ව විමසමින් සරල සංවාද ගොඩ නැගීමට උපදෙස් දෙන්න.

**පියවර 2**

- ජපානයේ පාසල් සිසුන්ට දෛනික ව ලැබෙන මුදල් ප්‍රමාණය, එම මුදල් වියදම් කරන ආකාරය හා අවශ්‍යතා පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට උපදෙස් දෙන්න.
- රැස් කරන ලද තොරතුරු ඇසුරින් ශ්‍රී ලංකාව සමග සසඳමින් සාකච්ජාවක් මෙහෙයවන්න.
- ඒ ඇසුරින් කෙටි සටහනක් පිළියෙල කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත (47 පාඩම සහ 50 පාඩම)
- රූප කාඩ්පත් (ස්ථාන, ක්‍රීඩා, වැඩසටහන්)

**තක්සේරුව හා ඇගයීම**

- නිවාඩු කාලයේ ගිය ස්ථානයක දී කළ දේ, ඒ ස්ථානය පිළිබඳ ව සහ එහි දී ලැබූ අත්දැකීම් පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- යහළුවන් නිවාඩු කාලය ගත කළ ආකාරය පිළිබඳ ව විමසයි.
- ජපන් ජාතික පාසල් සිසුන් දෛනික ව මුදල් වියදම් කරන ආකාරය මව්බසින් විස්තර කරයි.

**වැඩිදුර ගවේෂණය**

- https : // minnokyozai.jp

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

ශ්‍රේණිය :- 11 ශ්‍රේණිය

පාසල් වාරය :- දෙවන වාරය

නිපුණතා මට්ටම :- 7.3

විෂය සන්ධාරය

- ජපානයේ වාර්ෂික උත්සව හා එම උත්සව පැවැත්වෙන දින
- ජපානයේ වාර්ෂික උත්සවවල සුවිශේෂත්වය
- ශ්‍රී ලංකාවේ සහ ජපන් සංස්කෘතියේ සමාන අසමානතා
- ජපානයේ වාර්ෂික උත්සව පිළිබඳ පින්තූර, තොරතුරු ගොනු කිරීම

ආධාරකයේ ස්වභාවය :- පැවරුම

ආධාරකයේ අරමුණ :-

- ජපානයේ වාර්ෂික උත්සව හා එම උත්සව පැවැත්වීමේ අරමුණ පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම.
- ශ්‍රී ලංකාවේ හා ජපන් සංස්කෘතියේ සමානතා හා අසමානතා හඳුනා ගැනීම.

ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස්

- ජපානයේ වාර්ෂික උත්සව පිළිබඳ ව කණ්ඩායම් හෝ තනි තනි ව කරුණු සහ පින්තූර සෙවීමට උපදෙස් දෙන්න.
- ගුරුවරයා විසින් එක් එක් ශිෂ්‍යයාට/කණ්ඩායමට මග පෙන්වීමක් කරන්න.
- පහත කරුණු ඇතුළත් වන සේ සොයා ගත් කරුණු ගොනු කිරීමට උපදෙස් දෙන්න.
  - උත්සවයේ නම
  - පැවැත්වෙන දිනය
  - පැවැත්වීමේ අරමුණ / වැදගත්කම
  - අනුගමනය කරන විශේෂ සිරිත් විරිත්, ඇඳුම් පැලඳුම්, ආහාර පාන ආදීය
  - එක් එක් උත්සවයේ සුවිශේෂී අවස්ථා නිරූපණය වන පින්තූර හෝ ඡායාරූප
- ගොනු කරන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට දිනයක් හා නියමිත කාල සීමාවක් ලබා දී පහත සඳහන් නිර්ණායක යටතේ ඇගයීමට ලක් කරන්න.

| ශිෂ්‍යයාගේ නම | ඉදිරිපත් කළ කරුණුවල නිරවද්‍යතාව (ලකුණු 05) | කරුණු ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම (ලකුණු 05) | පැහැදිලි බව (ලකුණු 05) | පින්තූර/ඡායාරූප (ලකුණු 05) | ලකුණුවල එකතුව (ලකුණු 20) |
|---|---|---|---|---|---|
| | | | | | |

ඉතා හොඳයි - 12-15

හොඳයි - 09-11

මධ්‍යස්ථ - 05-08

සංවර්ධනය විය යුතුය - 0 -04